කෙටුම්පත් අංක 4.5
උපුටා දැක්වීමෙන් වළකින්න

ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් රාජ්‍ය සහ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය

තාක්ෂණ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

අගෝස්තු 2022

පටුන

1 හැඳින්වීම ---------- 2

1.1 පසුබිම ---------- 2

1.2 අවශ්‍යතාවය ---------- 3

1.3 අරමුණ ---------- 4

1.3.1 ඩිජිටල් ආර්ථිකය ---------- 4

1.3.2 ඩිජිටල් රාජ්‍ය ---------- 5

1.3.3 ඩිජිටල් නීති ---------- 6

1.3.4 ප්‍රතිපත්ති දිශානතිය ---------- 7

1.4 තාර්කික පදනම ---------- 8

1.4.1 ප්‍රධාන මූලධර්ම ---------- 8

2 යහපාලනය සඳහා වූ ඩිජිටල් රාජ්‍යයක් ---------- 10

3 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු ---------- 12

3.1 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 1 ---------- 13

3.2 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 2 ---------- 19

3.3 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 3 ---------- 21

3.4 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 4 ---------- 24

3.5 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 5 ---------- 30

3.6 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 6 ---------- 36

1 හැඳින්වීම

1.1 පසුබිම

ශ්‍රී ලංකා රජය තම ප්‍රතිපත්ති රාමුව 'සෞභාග්‍යයේ දැක්ම' නමින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම ජාතික ප්‍රතිපත්ති රාමුව ප්‍රධාන ප්‍රතිපත්ති නවයකින් සමන්විත වන අතර ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වෙන පවුලක්, විනයගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු ළඟාකර ගැනීම අපේක්ෂා කරයි. සමාජ, ආර්ථික, පාරිසරික සහ දේශපාලන අංශ කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වන එකී ප්‍රතිපත්ති නවය පහත පරිදි වේ.

1. ජාතික ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය
2. මිත්‍රශීලී සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්
3. දූෂණයෙන් තොර පරිපාලනයක්
4. ජනතා බලපොරොත්තු ඵලගැන්වෙන නව ව්‍යවස්ථාවක්
5. ඵලදායී පුරවැසියන් සහ ජවසම්පන්න මානව සම්පතක්
6. ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයක්
7. තාක්ෂණය මත පදනම් වූ සමාජයක්
8. භෞතික සම්පත් සංවර්ධනය
9. තිරසර පාරිසරික කළමනාකරණය සහ විනයගරුක, නීතිගරුක මෙන්ම වටිනාකම් මත පදනම් වූ සමාජයක්

මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ අතිගරු ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය මගින් ඩිජිටල් සංවර්තනය සඳහා වූ ප්‍රතිපත්තියත් එහි උපාය මාර්ගික රාමුවත් පහත දැක්වෙන ප්‍රධාන කුළුණු ත්‍රිත්වය සහ ඊට අදාළ අනු කුළුණු යටතේ අනුමත කර ඇත.

ඩිජිටල් රාජ්‍ය

- ඩිජිටල් පදනම
- ජාතික තොරතුරු හුවමාරුව
- හවුල් විසඳුම් (Shared Solutions)
- Line of Business විසඳුම්
- පොදු ප්‍රවේශය

ඩිජිටල් ආර්ථිකය

- තාක්ෂණ කර්මාන්ත සංවර්ධනය
- Start-up සංවර්ධනය
- තාක්ෂණ ව්‍යාප්තිය
- ධාරිතා සංවර්ධනය
- පළාත් පොකුරු සංවර්ධනය (Regional Cluster Development)

ඩිජිටල් සේවා

- රාජ්‍ය තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය
- තාක්ෂණ පරිවර්තනය හා බැඳුණු උපදේශන සේවා
- ඩිජිටල් අනන්‍යතා හැඳුනුම්පත් සත්‍යාපනය සහ අදාළ සේවා
- ඩිජිටල් ගෙවීම් සහ අදාළ සේවා

තාක්ෂණය

ඩිජිටල් නීති සහ ප්‍රතිපත්ති

1.2 අවශ්‍ය**තාවය**

ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් චින්තනයක් නිර්මාණය කිරීමේ මූලික අරමුණ වනුයේ මෙරට ජනතාව සවිබල ගැන්වීම වේ. මෙම ප්‍රතිපත්තියේ පරමාර්ථය වන්නේ නව අදහස්, සම්මතයන් සහ සාරධර්ම දිරිමත් කෙරෙන සමාජ ව්‍යුහයකට අනුව පුරවැසියන්ට තම සබඳතා පවත්වාගෙන යා හැකි මාධ්‍යයක් නිර්මාණය කිරීමයි.

මනාව ගොඩනගා ගත් ඩිජිටල් චින්තනයක් මගින් තාක්ෂණය හරහා එකිනෙක සම්බන්ධ වූ සහ තම ජීවිත පිළිබඳ විධිමත් පාලනයක් ඇති ප්‍රජාවන් ගොඩනගමින් වඩා කාර්යක්ෂම මෙන්ම ප්‍රතිඵල කේන්ද්‍රීය කරගත් සමාජයක් කරා පුරවැසි පෙළඹවීමක් සිදුකළ හැක. තවද එය ජන ජීවිතයට ධනාත්මක බලපෑමක් ඇතිවන පරිදි රජය සහ පද්ධතීන් දේශීයකරණයට ලක්කරමින් සංස්කෘතික වශයෙන් විධිමත්ව සකසන ආකාරය අවබෝධ කරදෙන උපකාරක මාධ්‍යයක් ද වනු ඇත.

තාක්ෂණ අමාත්‍යාංශයට පැවරී ඇති විෂය ක්ෂේත්‍රයක් වන 'ඩිජිටල් රාජ්‍ය', තොරතුරු සඳහා පහසු ප්‍රවේශය, ප්‍රතිපත්ති/තීරණ ගැනීමේදී මහජන උපදේශනය හරහා සහභාගීත්වය සැපයීම, මහජන සුබසාධනය සඳහා ස්වයංක්‍රීය සේවාවන්ට ඉඩ සැලසීම සහ විනිවිදභාවය තහවුරු කරමින් රජයේ කාර්යයන් විධිමත් කිරීම යනාදිය මගින් ශ්‍රී ලංකා පුරවැසියන් සවිබල ගැන්වීමක් සිදු කරයි.

මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව ඩිජිටල් රාජ්‍යයක් කරා මෙහෙයවන ගමන් මාර්ගයට සමපාත වේ. ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්තියේ පූර්ව සංස්කරණයක් 2009 වසරේදී අනුමත කරන ලද අතර මෙම අනුවාදය මගින් එය බැහැර කෙරේ.

1.3 අරමුණ

1.3.1 ඩිජිටල් ආර්ථිකය

ඩිජිටල් ආර්ථිකය යනු කාර්යක්ෂමතාව ළඟා කරදෙන රටේ ඩිජිටල් සංවර්ධනයෙහි කේන්ද්‍රීය සාධකයක් වේ. මේ අනුව, මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය මෙහෙයවන උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරමින්, කර්මාන්ත ව්‍යාප්තියට සහ සෘජු විදේශ ආයෝජන ඉහළ නැංවීමට පහසුකම් සපයන අතරම ධාරිතා සංවර්ධනය (Capacity Building) සහ තාක්ෂණික ව්‍යාප්තිය තුළින් නවෝත්පාදන සහ නව ව්‍යවසායකත්වය සඳහා අවස්ථා නිර්මාණය කරයි. දේශීය සමාගම් සඳහා රැකියා සහ ව්‍යාපාර අවස්ථා විවෘත වන අතරම රටේ තාක්ෂණ කර්මාන්තය වසර 2024 වන විට ඩොලර් බිලියන 3ක අපනයන ආදායම් ලබන ක්ෂේත්‍රයක් වීමේ ඉලක්කය කරා ස්ථාවරව ගමන් කරනු ඇත. ඩිජිටල් රාජ්‍යයක් ගොඩනැගීම මගින් ශ්‍රී ලංකාවට ව්‍යපාර දර්ශක වල ඉහළ ශ්‍රේණිගත කිරීමකට පැමිණීමට හැකිවන අතරම ආයෝජන මධ්‍යස්ථානයක් ලෙස මෙරට තෝරාගැනීමට ජාත්‍යන්තර ආයෝජකයින් අතර පෙළඹවීම වැඩි කරවයි.

වසර 2024 වසර වනවිට ශ්‍රී ලංකාව සුරක්ෂිත, සමෘද්ධිමත්, දැනුම පාදක කරගත් සහ සියලු පුරවැසියන් ආවරණය කෙරෙන තිරසර ස්වෛරී රාජ්‍යයක් ලෙස පරිවර්තනය කිරීම මගින් පුරවැසියන් සඳහා වඩා යහපත් ජීවන තත්ත්වයන් සකසා දීමට ඉවහල් වන ප්‍රධාන කුළුණු ත්‍රිත්වයෙන් එකක් ලෙස ඩිජිටල් රාජ්‍යයක් ගොඩනැගීම සැලකේ.

1.3.2 **ඩිජිටල්** රාජ්‍ය

ඩිජිටල් රාජ්‍ය නැමැති සංකල්පය රජයක් විසින් වඩා කාර්යක්ෂමව හා අර්ථාන්විත ලෙස තම සේවා සපයමින් පුරවැසියන් සමඟ සබඳතා ඇතිකර ගැනීමේ සහ එම සබඳතා පවත්වා ගැනීමේ ක්‍රමවේදය ක්‍රමිකව ප්‍රතිනිර්මාණය කරයි. තවද එමඟින් වැඩි විවෘතභාවයක් සහ ගතික සහභාගිත්වයක් තහවුරු කරමින් රජයේත් පුරවැසියන්ගේත් කාර්යභාරය නැවත අර්ථ දක්වමින් පුරවැසියා රාජ්‍ය ක්ෂේත්‍රය මැදට ගෙන එයි. හුදෙක් පොදු සේවා සැපයීමෙන් ඔබ්බට යමින් විනිවිදභාවය, සියලු පුරවැසියන් ආවරණය සහ පුරවැසි අයිතීන්ගේ සුරක්ෂිතභාවය ඇතුළු වඩා පුළුල් වූ ප්‍රජාතන්ත්‍රවාදයක් නිර්මාණය කිරීමට ඩිජිටල් රාජ්‍ය සංකල්පය හරහා රජයයන් සමත් වී ඇත. තවද ඩිජිටල් රාජ්‍ය විසඳුම් මඟින් කෘෂිකර්මය, නිෂ්පාදනය, ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය යනාදී නොයෙකුත් අංශයන් නියෝජනය කෙරෙන විවිධ රාජ්‍ය ආයතන එකට එකතු කිරීමක් සිදු කරයි. ශ්‍රී ලංකා අද්විතීය ඩිජිටල් අනන්‍යතාවය (Sri Lanka Unique Digital Identity/SLUDI) සහ ඩිජිටල් අස්සන යනු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මඟින් ශ්‍රී ලංකාව තාක්ෂණය මත පදනම් වූ සමාජයක් කරා මෙහෙයවීමට හඳුන්වාදෙන ලද එවැනි මුලපිරීම් දෙකකි.

මෙම සංවර්තනය යථාර්තයක් බවට පත්කර ගැනීමෙහි ලා මෑතකාලීනව ගෝලීය ප්‍රවණතාවක් බවට පත්ව ඇති ඩිජිටල් තාක්ෂණ වර්ධනයන් සහ ඒවායේ වැඩි භාවිතය ඉවහල් වී ඇත. උදාහරණයක් ලෙස 2022 මාර්තු මස වනවිට ශ්‍රී ලංකා විදුලි සංදේශ ක්ෂේත්‍රයෙහි දළ සංඛ්‍යාත්මක විශ්ලේෂණය පහත පරිදිය[1]. මෙම දත්ත මිලියන 22ක්[2] පමණ ජනගහනයකින් යුතු ශ්‍රී ලංකාව වැනි රටකට ඉතාම වැදගත් වේ.

[1] https://www.trc.gov.lk/images/pdf/Statics_2022_May.pdf
[2] ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව 2021
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2021/en/16_S_Appendix.pdf

සේවා කාණ්ඩය	ප්‍රමාණය (මිලියන)
සමස්ත ස්ථාවර සබඳතා ප්‍රමාණය	3.8
සමස්ත ස්ථාවර පුළුල් පරාස සබඳතා ප්‍රමාණය	2.6
සමස්ත ස්ථාවර හඬ සහ දත්ත (voice and data) සබඳතා ප්‍රමාණය	1.8
සමස්ත ස්ථාවර දත්ත (data only) සබඳතා ප්‍රමාණය	1
සමස්ත ජංගම සබඳතා ප්‍රමාණය	31
සමස්ත ජංගම පුළුල් පරාස සබඳතා ප්‍රමාණය (3G and 4G)	19
සමස්ත ජංගම හඬ සහ දත්ත (voice and data) සබඳතා ප්‍රමාණය	21

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම, 2022

1.3.3 ඩිජිටල් නීති

ඉලෙක්ට්‍රොනික දත්ත සහ ඉලෙක්ට්‍රොනික ලිකියවිලි කාර්යාලීය/පෞද්ගලික කටයුතු සඳහා භාවිතය, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු සිදුකිරීම යනාදිය සම්බන්ධව අවශ්‍ය නීතිමය රාමුව සකසා දෙමින් ඩිජිටල් නීති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය තුළ විශාල කාර්යභාරයක් ඉටු කරයි. ඩිජිටල් රාජ්‍යයක් ස්ථාපිත කිරීමෙහි මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය රාජ්‍ය යාන්ත්‍රණය තුළ භාවිතයෙහි දී බලපාන ප්‍රධානතම ව්‍යවස්ථාව වනුයේ 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතයි. 'ඩිජිටල් සහතික' වැනි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් ඉලෙක්ට්‍රොනික අත්සන භාවිතා කරන්නන්ට ක්‍රිප්ටෝ (Crypto) පද්ධතීන් සහ හැෂ් ශ්‍රිතය මඟින් රහස්‍යභාවයත් සත්‍යතාවත් අත්පත් කරගත හැකිය. 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පිළිබඳ පනත පරිගණක අපරාධ හඳුනා ගැනීමට උපකාරී වන අතරම එම අපරාධ පිළිබඳ විමර්ශන සිදු කිරීමට අදාළ වැඩපිළිවෙල පැහැදිලි කරයි. 2022 අංක 19 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත මඟින් පෞද්ගලික දත්ත සැකසීම නියාමනය සඳහා අවශ්‍ය පසුබිම සපයයි. සයිබර් ආරක්ෂණ පනත ක්‍රියාවට නැංවීමෙන් පසුව සයිබර් ආරක්ෂණ ඒජන්සියක් පිහිටුවීම සඳහා විධිවිධාන සලසා ඇති අතර එය ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අදාළ සියලු කාරණා පිළිබඳව වන ඉහළම බලතල සහිත විධායක ආයතනය ලෙස ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දරයි.

ව්‍යාපාර සමඟ ගනුදෙනු කිරීමෙන් ලද ඩිජිටල් අත්දැකීම් හේතුවෙන් රාජ්‍ය සේවාවන් පිළිබඳ මහජන අපේක්ෂාවන් වැඩිවෙමින් පවතී. එබැවින් ඔවුන් රාජ්‍ය පරිපාලනය ඔවුන්ගේ ක්‍රමවේදයන්ට අනුගතවීම අපේක්ෂා කෙරෙන අතර ඊට ප්‍රතිවිරුද්ධ දෙයක් අපේක්ෂා නොකරයි. මෙම තත්ත්වය හේතුවෙන් රාජ්‍ය සේවාවන් පුරවැසියන්ගේ දොරකොඩටම සැපයීමට නම් රජයන් ඩිජිටල් තාක්ෂණය භාවිතය මගින් පරිවර්තනයකට අනුගත විය යුතු වන අතර එය රජයන්ට දැඩි අභියෝගයක් වී ඇත.

1.3.4 ප්‍රතිපත්ති දිශානතිය

2003 අංක 27 දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2008 අංක 33 දරණ සංශෝධන පනත) මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් සහ උපායමාර්ගයන් රජයට හඳුන්වා දීමට සලසා ඇති විධිවිධානයන්ට අනුකූල වෙමින් ශ්‍රී ලංකා රජයට ඩිජිටල් රාජ්‍යයක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය වටපිටාව සපයයි. තවද මෙමඟින් ද්වීගුණනය (Duplication) අවම කිරීම, උපරිම සම්පත් භාවිතය, රාජ්‍ය ආයතන අතර සහජීවනය සහ පුරවැසියන්ටත් ව්‍යාපාරයන්ටත් අඛණ්ඩ සේවා සැපයීම යනාදිය ළඟා කරගැනීම සඳහා රාජ්‍ය ආයතන අතර සහයෝගිතාව සහ සම්බන්ධීකරණය ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරෙන 'සමස්ථ රාජ්‍යය' යන සංකල්පය ප්‍රචලිත කරවයි. මෙම ප්‍රතිපත්තිය මූලික පදනම ලෙස අනුගමනය කරමින් 'ඩිජිටල් රාජ්‍යය' යන සංකල්පය ප්‍රචලිත කිරීමට රජය විසින් හඳුන්වා දෙන අනෙකුත් ප්‍රතිපත්තින්ටද අනුකූල වීම ද රාජ්‍ය ආයතන සතු වගකීමකි.

1.4 තාර්කික පදනම

1.4.1 ප්‍රධාන මූලධර්ම

මෙම ප්‍රතිපත්තිය මඟින් පහත සඳහන් ප්‍රධාන මූලධර්මයන් පිළිගෙන ඇත. එම මූලධර්ම ඩිජිටල් රාජ්‍ය විසඳුම් ක්‍රියාවට නැංවීමේදී නිසි පරිදි යොදාගත යුතුය.

- ජනාධිපති ලේකම් කාර්යාලය, තාක්ෂණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය, ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිසම, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) ආදී ආයතන මඟින් ඩිජිටල් රාජ්‍යයට අදාළ ක්‍රියාපටිපාටීන් සම්බන්ධව නිකුත් කෙරෙන නිර්දේශ සහ රාමු.

- දත්ත ආරක්ෂණ සහ සයිබර් ආරක්ෂණ පනත් වල ඇතුලත් විධිවිධාන

- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය විසින් සම්පාදිත දත්ත වර්ගීකරණ රාමුව, දත්ත හුවමාරු කිරීමේ ප්‍රතිපත්ති, ඩිජිටල් පරිණත ආකෘතිය (Digital Maturity Model) සහ ඩිජිටල් ධාරිතා රාමුව (Digital Competency Framework).

- ව්‍යාපාර විසඳුම් සඳහා වන රාජ්‍ය උපායමාර්ග (Strategies) (යෙදුම් සංවර්ධනය/සහාය සහ නඩත්තු කිරීම).

- ආරක්ෂාවට මුල්තැන : නිෂ්පාදනයන් මූලිකවම ආරක්ෂාව තහවුරු වන පරිදි නිර්මාණය කිරීම.

- පෞද්ගලිකත්වයට මුල්තැන : නිෂ්පාදන, සේවා, භාවිතයන්, මාර්ගෝපදේශයන්, යටිතල පහසුකම් සංවර්ධනයේදී පුරවැසියන්ගේ පෞද්ගලිකත්වය පිළිබඳ ආරක්ෂාව තහවුරු කිරීම.

- ප්‍රවේශයට මුල්තැන : භාණ්ඩ හා සේවාවන් සැමටම පරිහරණය කළ හැකිවීම (ආබාධිත සහ සුළුතර පිරිස් සඳහා වැඩි අවධානයක් යෙදීම).

- ජංගම සේවා සඳහා මුල්තැන : නිර්මාණකරණයේදී වෙබ් අඩවි නිර්මාණකරුවන් විසින් මුලින්ම ජංගම උපකරණ සඳහා තම නිර්මාණ සැකසීම.

- ත්‍රෛභාෂාවට මුල්තැන : ජාතික භාෂා ප්‍රතිපත්තිය[3]ට අනුකූලව දත්ත සහ තොරතුරු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි[4] යන භාෂා ත්‍රිත්වයෙන්ම ලබා ගැනීමේ හැකියාව.

- තිරසාරත්වය, පිරිවැය ඵලදායිතාව සහ ඵලදායිතාව ලඟා කරගැනීම.

තවද ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්තිය 2020 ජනවාරි 13වන දින නිකුත් කරන ලද ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/GPA/Circular/01/2020[5] මඟින් හඳුන්වා දී ඇති විධිවිධානයන් අනුගමනය කිරීමට රාජ්‍ය ආයතන වලට නියම කරයි. මෙම චක්‍රලේඛයෙහි කරුණු අංක (b) මඟින් ශ්‍රී ලංකා රජය හඳුන්වා දෙන ජාතික ඩිජිටල් මුලපිරීම් මෙහෙයවීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත බලතල පවරා ඇත.

[3] ජාතික භාෂා දෙපාර්තමේන්තුව
https://www.languagesdept.gov.lk/web/index.php?option=com_content&view=article&id=38:official-languages-policy&catid=2:uncategorised&lang=en&Itemid=163

[4] සියලු රාජ්‍ය ආයතන පරිගණක කටයුතු (ලේඛන/වෙබ් අඩවි/මෘදුකාංග පද්ධති නිර්මාණය සහ ඉලෙක්ට්‍රොනික තොරතුරු සම්ප්‍රේෂණය) සඳහා සිංහල සහ දෙමළ භාෂා යුනිකෝඩ් භාවිතා කිරීම. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිංහල සහ දෙමළ යතුරු පුවරු සැලැස්ම සහ යෙදවුම් ක්‍රම ප්‍රමිති අංක SLS 1134 : 2004 (පළමු කොටස ද ඇතුළුව) සහ SLS 1326: 2008 යටතේ ප්‍රමිතිකරණය කර ඇත.

[5] ඇමුණුම් අංක 1 - ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/GPA/Circular/01/2020

2 යහපාලනය සඳහා වූ ඩිජිටල් රාජ්‍යයක්

ශ්‍රී ලංකාව තුල 'ඩිජිටල් රාජ්‍යයක්' පිළිබඳ සංකල්පයෙහි දැක්ම වනුයේ කාර්යක්ෂමතාව, ප්‍රතිචාර දැක්වීම, සහභාගිත්වය සහ නව්‍යකරණය යනාදී යහපාලන මූලධර්ම අනුගමනය කරන පුරවැසි හිතකාමී ආයතනයක් ලෙසට රාජ්‍යය පරිවර්තනය කරමින් පුරවැසියන්ට යහපත් ජීවන තත්ත්වයක් උදාකර දීමයි.



'තෘප්තිමත් පුරවැසියෙක්' සහ 'යහපාලනයක්' යන මූලික සංකල්පයන්ට යටත්ව පහත දැක්වෙන අරමුණු හය ප්‍රකාශ කර ඇත.

1. ඩිජිටල් රාජ්‍ය පාලනයෙහි ප්‍රධානම සහ වැදගත්ම අංගය වනුයේ පුරවැසියායි. තොරතුරු හෝ ගනුදෙනු මත පදනම් වන සියලු විද්‍යුත් රාජ්‍ය සේවාවන් **පුරවැසියන්ගේ පහසුව (Citizen Convenience)** වෙනුවෙන් සැලසුම් කල යුතුය.

2. ඩිජිටල් රාජ්‍ය පාලනය තුල ක්‍රියාකාරී **පුරවැසි සහභාගිත්වය (Citizen Participation)** මඟින් අත්පත් කරගන්නා විසඳුම් වැඩි පුරවැසි නියෝජනයක් පිළිබිඹු කරයි. එමඟින්

තොරතුරු හා සේවාවන් සඳහා වන ජනතා ඉල්ලුමට ගරු කරමින් ඔවුන්ගේ බලාපොරොත්තු ඉටුවන වඩා හොඳ සේවාවක් ලබාදීමට ඉඩකඩ සපයයි.

3. වඩා ශක්තිමත් නෛතික රාමු ස්ථාපිත කිරීම මගින් **ජනතා අයිතීන් (Citizen Rights)** සුරැකීමට ඩිජිටල් රාජ්‍ය සහතික වෙයි.

4. ඩිජිටල් රාජ්‍ය පාලනයේ අරමුණ වන්නේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය උපරිමකර ගැනීමට ක්‍රියාකාරී අයුරින් පවතින ක්‍රියාදාමයන් නැවත සැලසුම් කර සමාජයට ධනය, කාලය, පරිසරය සහ වටපිටාව යන අංශ මගින් අර්ථාන්විත ප්‍රතිඵල උපරිමකර දෙමින් **වියදම අවම කරගැනීමට (Cost Savings)** කටයුතු කිරීමයි.

5. **විනිවිදභාවය (Transparency)**, විවෘතබව සහ ප්‍රතිචාර දැක්වීම මගින් දූෂණයෙන් සහ වංචාවෙන් තොර සමාජයක් බිහිකිරීමට ඩිජිටල් රාජ්‍යය කටයුතු කරයි.

6. ඩිජිටල් රාජ්‍ය පාලනය වනාහී වෙනසක් අත්පත් කරගැනීම අරමුණු කරගත් උපායමාර්ගයක් මිස අවසන් ඉලක්කයක් නොවෙයි. එය සමාජය ජීවත්වීමට හැකි වඩා ශිෂ්ටසම්පන්න, ප්‍රබුද්ධ, සානුකම්පිත, සෞඛ්‍යසම්පන්න සහ තිරසාර ස්ථානයක් බවට පත්කිරීම වෙනුවෙන් දියුණු තාක්ෂණික විසඳුම් හඳුන්වාදෙන සහ ඒ පිළිබඳ පර්යේෂණ සිදු කරන අඛණ්ඩ නව්‍ය**කරණ සංවර්තනයක් (Innovative Transformation)** වේ.

මෙම සියලුම අරමුණු වර්තමාන සමාජ පාලනයෙහි තිබෙන ප්‍රධානතම සංකල්පය වන යහපාලනය පිළිබඳ සංකල්පයෙන් පැනනගියි. එබැවින් මෙම අරමුණු යහපාලනය නැමැති සංකල්පය සමඟ ගැලපිය යුතුය. ඒ අනුව ඉහත සඳහන් කර ඇති එක් එක් අරමුණ යුරෝපා කවුන්සිලය මගින් යහපාලනය පිළිබඳ ප්‍රකාශයට පත්කර ඇති මූලධර්ම[6] දොළහෙන් යම් මූලධර්ම දෙකකට ඈඳා ඇත.

[6] ඇමුණුම් අංක 2 - ඩිජිටල් රාජ්‍ය අභිලාෂයන් යුරෝපා කවුන්සිලයේ යහපාලන අරමුණු හා බැඳුනු 'පාලනයේ විශිෂ්ටත්වය පිළිබඳ යුරෝපීය ලේබලයට' අදාළ ආකෘතිය සමඟ ගැලපීම

3 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු

මෙම පිටුව චේතනාන්විතව හිස් පිටුවක් ලෙස තබා ඇත

3.1 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 1

ඩිජිටල් රාජ්‍යයක **ප්‍රමුඛතාව** මෙන්ම **කේන්ද්‍රීය** සාධකය වන්නේ පුරවැසියාය. සියලු ඩිජිටල් **රාජ්‍ය** සේවාවන් (තොරතුරුමය හෝ ගනුදෙනුමය), පුරවැසියන්ගේ (පුද්ගලයින් හෝ **ව්‍යාපාර)** පහසුව අරමුණු කරගනිමින් සකස් කරනු ලැබේ.

ඕනෑම සාර්ථක ඩිජිටල් සංවර්තනයක හදවත වන්නේ තාක්ෂණය නොව පුරවැසියායි. මෙනිසා ඩිජිටල් රාජ්‍ය සංවර්තනයේ කේන්ද්‍රය ලෙස පුරවැසියා සලකණු ලැබේ.

ඩිජිටල් රාජ්‍යයේ පුරවැසියන්ගේ ජීවිත වඩාත් ඉහළට ඔසවා තැබීම සදහා සරල සහ පහසුවෙන් අවශ්‍ය තොරතුරු භාවිතා කිරීමට වේගවත් සහ කාර්යක්ෂම ඩිජිටල් සේවාවන් සපයයි. ඒ සදහා පහසු , වඩාත් කාර්යක්ෂම හා ඵලදායී යෙදවුම් මගින් පුරවැසියන් වෙත පහසුවෙන් ළඟාවීමට හැකි ලෙස සැලසුම් සකස්කළ යුතුවේ. නව්‍ය තාක්‍ෂණයන්හි පූර්ණ හැකියාවන් විවර කෙරෙන නව්‍ය විසඳුම් හරහා මෙය සිදු කෙරේ. ඩිජිටල් රාජ්‍ය සේවාවන් තොරතුරුමය හෝ ගණුදෙණුමය වේවා, සෑම පුරවැසියෙකුටම පහසු අයුරින් නොමිලේ හෝ දැරිය හැකි මිලකට ලබාගැනීමට හැකිවීම මෙම ක්‍රියාවලියේ ප්‍රධානතම සාධකයයි.

ඩිජිටල් රාජ්‍ය විසඳුම් ඔවුන්ගේ සමාජ, ආර්ථික මට්ටම් හෝ භෞමික පිහිටීම් නොසලකා පුරවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට තවදුරටත් පහසුකම් සැපයිය යුතුය.

මේ සඳහා ගතයුතු ක්‍රියා මාර්ග වන්නේ ;

1. පොදු මහජනතාවට අවශ්‍ය සියලුම අදාළ තොරතුරු රාජ්‍ය ආයතන විසින් විවිධ මාධ්‍ය උපයෝගි කරගනිමින් ප්‍රකාශයට පත්කරමින් විටින්විට යාවත්කාලින කළ යුතුයි.

    a. මෙම තොරතුරු www.gov.lk රාජ්‍ය සේවා වේදිකාව හරහා සෑම විටම ත්‍රෛභාෂා පදනමින් ඉදිරිපත්කිරීම අනිවාර්‍යී සේ සැලකිය යුතුය.

    b. ඉහත ඒවාට අමතරව සමාජ මාධ්‍ය ඇතුළු අනෙකුත් සියලුම ඩිජිටල් නාලිකා භාවිතා කරමින් මහජනයා සමඟ වඩාත් ක්‍රියාශීලි තොරතුරු බෙදාහදා ගැනීම සඳහා සුදුසු මාධ්‍යයකින් ඔවුන් හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් ඵලදායී සංවාද ආරම්භ කලයුතු වේ.

i. පිළිගත් නායකත්වයන්හි හා සංවිධානයන්හි තහවුරු කරන ලද සමාජ මාධ්‍ය ගිණුම් මෙම කාර්යය සඳහා භාවිතා කළ යුතු වේ.

ii. සමාජ මාධ්‍ය හැසිරවීම පිළිබඳ පාලන ප්‍රතිපත්ති

c. සෑම විටම අදාළ සහ යාවත්කාලීන බව සහතික කරමින් ප්‍රකාශනය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම, එකතු කිරීම, පරිවර්තනය කිරීම සහ සැපයීම සඳහා අභ්‍යන්තර යාන්ත්‍රණයක් ගොඩනැගිය යුතුවේ.

d. 2022 අංක 19[7] දරණ දත්ත ආරක්ෂණ පනතට අනුගත වෙමින් මහජනතාවට අවශ්‍ය තොරතුරු, ඔවුන්ට වඩා පහසුවෙන් අවබෝධ වන භාෂාවකින්, තොරතුරු දැනගැනීමේ මූලධර්මයන්ට අනුව නිසිකලට සක්‍රීයව හෙළිදරව් කිරීමට පියවර ගැනීම.

e. පුරවැසියන්ට අදාළ සියලුම ආකෘති, මාර්ගෝපදේශ, චක්‍රලේඛ සහ වෙනත් ඕනෑම පැරණි ලේඛනයක්, ඩිජිටල් ආකෘතියක් ලෙස සියලුම මාධ්‍යයන් ඔස්සේ බාගතකර ලබාගැනීමට හැකිවිය යුතුය.

2. පුරවැසියන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා අන්තර්ක්‍රියාකාරී ලෙස ප්‍රතිචාර දැක්වීම.

a. සියලුම රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල සඳහා එක් එක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි විද්‍යුත් තැපැල සහ සාමූහික පහසුකම් සපයීම.

b. දත්ත ආරක්ෂණය පිළිබඳ නියමිත නීතිමය ප්‍රතිපාදන වලට යටත්ව නිලධරයකුට ඇති ස්වයංක්‍රීය තීරණ ගැනීමේ විධිවිධාන අනුගමනය කරමින්, දත්ත සහ පරිගණක ස්වයංක්‍රීයකරණයේ සහාය ඇතිව, රාජ්‍ය නිලධරයන් විසින්, නියමිත වේලාවට නිවැරිදි තීරණ ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

[7] https://www.icta.lk/icta-assets/uploads/2022/03/09-2022_S.pdf

c. කාර්යක්ෂම සහ වේගවත් ඩිජිටල් රාජ්‍ය සේවා පවත්වාගෙනයාම සඳහා 24x7 පදනමින් මංගත (Online) සේවා පහසුකම් ලබා දීම.

d. රාජ්‍ය යාන්ත්‍රණයේ (ඩිජිටල් ක්‍රම හරහා) අනෙකුත් පාර්ශ්වයන් සමඟ බාධාවකින් තොරව සම්බන්ධ වීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම, මගින් සේවාදායකයාගේ අපේක්ෂාවන් ඉක්මණින්ම ඉටුකිරීම.

e. විද්‍යුත් තැපෑලෙන් හෝ විකල්ප මාර්ගවලින් පුරවැසියන් විසින් කරන ලද විද්‍යුත් විමසීම්වලට රාජ්‍ය නිලධරයන් විසින් අර්ථවත් හා කඩිනම් ප්‍රතිචාර දක්වන බවත් එම ප්‍රතිචාරය ඒ ආකාරයෙන්ම සිදු කරන බව සහතික කිරීම, තහවුරු කරගැනීම.

f. රාජ්‍ය ආයතන අන්තර්සහයෝගී ප්‍රවේශයක් අනුගමනය කරමින් 'කිසිදු දොරක් වසා නැත' යන ප්‍රතිපත්තිය සාමූහිකව අනුගමනය කරයි. එනම් රජයට ප්‍රවේශ වීමට පුරවැසියෙකු තෝරා ගන්නා ඕනෑම රජයේ ආයතනයක ඕනෑම මාධ්‍යයක් මඟින් ජනතා විමසීම් වලට ප්‍රතිචාර දැක්වීම.

g. රජයේ සේවාවන් භාවිතයේදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණදෙන පුරවැසියන් වෙනුවෙන් 24පැය ත්‍රෛභාෂාවෙන් ක්‍රියාත්මක වන, වැඩ කරන කාලය තුළ අවම මෙහෙයුම් කාලයක් සමඟ, උපකාරක දුරකථන සේවාවක් සැපයීම.

3. ඩිජිටල් රාජ්‍ය සේවා ලබාදීමේ ප්‍රමිතීන් ආයතන තුළ ස්ථාපිත කිරීම මගින් මහජනතාවගේ විශ්වාසය දිනා ගැනීම.

a. ඉක්මන්, අර්ථවත් සහ ප්‍රතිචාරාත්මක සේවා සැපයීමේදී අන්තර්ක්‍රියා පවත්වාගැනීමට රාජ්‍ය ආයතන විසින් බහුකාර්ය කියෝස්ක් (multipurpose kiosks), විද්‍යුත් තැපෑල, අන්තර්ජාලය, හඬ, කෙටි පණිවුඩ සේවා, ජංගම දුරකථන යෙදුම්, ඊ-සේවා ඇතුළු, නමුත් ඒවාට පමණක් සීමා නොවී, බහුවිධ මාධ්‍යයන් භාවිතා කිරීම.

b. මහජන තෘප්තිය තීරණය කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතන මගින් ලබාදෙන ඩිජිටල් සේවාවන්ගේ ශක්‍යතාව, ගුණාත්මකභාවය සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් පරිපාලකයින් විසින් අඛණ්ඩව අධීක්ෂණය කිරීම,

c. මහජනතාවට තමන් සේවා ලබාගන්නා මාධ්‍ය මගින්ම එම සේවාවේ ගුණාත්මක භාවය ඇගයීමට හා ප්‍රතිචාර දැක්වීමට සැමවිටම ඉඩ සලසාදීම.

d. සෑම ආයතනයකම සේවා තත්ත්වයන් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පවතින සේවාවන් පිළිබද විවේචන ප්‍රතිචාර සංඛ්‍යා නිතිපතා ප්‍රසිද්ධ කිරීම.

e. අභ්‍යන්තර ක්‍රියාවලි/ප්‍රතිපත්ති දැනට පවතින දත්ත ආරක්ෂණය සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ නෛතික සහ ව්‍යවස්ථාදායක නියෝගවලට අනුකූල වන බව සහතික කිරීම .

4. ඩිජිටල් වශයෙන් කොන්වූ, තොරතුරු තාක්ෂණ දැනුම නොමැති, විවිධ ආබාධ සහිත, ජනකොටස් සදහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පදනම් වූ බහුවිධ මාධ්‍ය සේවා සැපයීමේ යාන්ත්‍රණයක් සැකසීම හා ඒ බව සහතික කිරීම.

5. පවතින සේවාවන්ට අමතරව වඩාත් ප්‍රචලිත සන්නිවේදන උපාංගයක් වූ ස්මාර්ට් ජංගම දුරකථන හරහා ඩිජිටල් රාජ්‍ය සේවා සැපයීමට ප්‍රමුඛත්වය දෙමින් "Mobile First" උපායමාර්ග අනුගමනය කිරීම.

a. දැනට පවතින අවම අවශ්‍යතා පමණක් සපිරීමට හැකි දුරකථනයක් පමණක් ඇති අයකුට පවා ප්‍රයෝජන ගතහැකි ලෙස නව ඩිජිටල් රාජ්‍ය සේවාවන් සරල කිරීම.

b. එක් එක් පරිශීලක උපාංග (පරිගණක, ටැබ්, ස්මාර්ට් ජංගම දුරකථන) සඳහා ප්‍රතිචාරාත්මක වෙබ් නිර්මාණ ශිල්පීය ක්‍රමවේදයන්ට අනුව ඒවායෙහි ලක්ෂණ සැලකිල්ලට ගනිමින්[8] වෙන වෙනම සැලසුම් කරන ලද විසඳුම් ඉදිරිපත් කිරීම.

[8] උදාහරණයක් ලෙස, ස්මාර්ට් ජංගම දුරකථන තිරය පරිගණක තීරයකට වඩා ප්‍රමාණයෙන් කුඩා වේ. එබැවින් ස්මාර්ට් ජංගම දුරකථන පරිශීලකයෙකුට මුද්‍රිත පිටපතක් ගැනීම අපහසු විය හැක.

c. විසඳුම් නිර්මාණයේදී ප්‍රගතිශීලි දියුණුවක් (විසඳුම් නිර්මාණයේදී පහළ මට්ටමේ බ්‍රවුසරයක් මගින් ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ සිට ක්‍රමයෙන් වඩා වැඩිදියුණු කළ විශේෂාංග හඳුන්වා දෙමින් ඉහළ මට්ටමක් දක්වා උසස් කිරීම) මිස අවක්‍රමණය අනුගමනය නොකිරීම. එමඟින් පහළ මට්ටමේ බ්‍රවුසර පරිශීලකයන්ට ඉහළ මට්ටමේ යෙදුමක සරල අනුවාදයක් භාවිතා කළ හැකි වේ.

d. ස්මාර්ට් ජංගම දුරකතනයක්, විශේෂාංග දුරකථනයක් හෝ මූලික දුරකථනයක් වැනි විවිධ වර්ගයේ ජංගම දුරකථන සඳහා ඒවායේ ඇති හැකියාවන් පදනම් කරගනිමින් විසඳුම් ඉදිරිපත්කිරීම.

e. ඩිජිටල් රාජ්‍ය සේවා ස්මාර්ට් ජංගම දුරකථන භාවිතයෙන් සිදුකිරීම පිළබද මහජනතාව දැනුවත් කිරීමට ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබාදීම.

6. රජයේ ආයතන විසින් නව යෙදෙවුම් ආරම්භ කිරීමේදී මහජනතාවට "පහසුවෙන් ප්‍රවේශ විය හැකිබව" ට ප්‍රමුඛත්වය දී ඇතිබව සහතික කල යුතුය.

7. ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් සන්නිවේදනය සහ ගනුදෙනු පිළිබඳ ව්‍යවස්ථා වලට අනුකූලව ඩිජිටල් හඳුනාගැනීමට අදාළ තත්කාලීන ප්‍රමිතින් පිළිගැනීම සහ බලධාරීන් විසින් ඩිජිටල් අස්සන් හා ඩිජිටල් සහතික පිළිගැනීම.

8. ඕනෑම රාජ්‍ය තොරතුරු පද්ධතියකට ශ්‍රී ලංකා අද්විතීය ඩිජිටල් අනන්‍යතාවය (Sri Lanka Unique Digital Identification) භාවිතා කර එක් ප්‍රවේශයකින් පුරවැසියන්ට අවශ්‍ය සේවාවන් ලබාගැනීමට ඉඩසලසා දිය යුතුය.

9. ඩිජිටල් රාජ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා ඩිජිටල් ගෙවීම් විකල්ප දිරිමත් කිරීම .

a. ඒ ඒ විකල්ප ගනුදෙනු වේදිකාවන් සමග පර්යේෂණ හා අත්හදාබැලීම් සිදුකොට රාජ්‍ය ඩිජිටල් සේවා සැපයීමට වඩාත් සුදුසු වේදිකාවක් සොයාගැනීම.

b. ඩිජිටල් රාජ්‍ය සේවා ගෙවිම් සඳහා පුළුල් පරාස ඩිජිටල් ගෙවීම් ක්‍රම ලබා දීම.

c. සාම්ප්‍රදායික ක්‍රම හරහා රජයේ සේවාවන් භාවිතා කිරීමෙන් මහජනතාව ක්‍රමානුකූලව අධෛර්යමත් කිරීම සඳහා හැකි සෑම විටම ඩිජිටල් රාජ්‍ය සේවාවනට අමතර අගයක් එකතුකිරීම.

d. අදාළ නීති සහ රෙගුලාසි මගින් අනුමත ක්‍රමවලට යටත් ඩිජිටල් ගෙවීම් විකල්පයන් සඳහා පහසුකම් සැලසීම සිදුවන වන බව සහතික කිරීම.

10. ඩිජිටල් රාජ්‍ය සේවා සම්බන්ධ පුරවැසියන්ගේ පැමිණිලි, දුක්ගැනවිලි සහ යෝජනා ක්‍රමානුකූලව සොයාබැලීම සහ එමගින් අදාළ සේවා වැඩිදියුණු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

11. පුරවැසියන්ගේ/ව්‍යාපාරික තෘප්තිය සක්‍රීයව අධීක්ෂණය සහ ඇගයීමට ලක් කරමින් ඒ ඒ වේදිකාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණුකොට පුරවැසියන්ට තෘප්තිමත් ඩිජිටල් රාජ්‍ය සේවාවක් ලබාදීම.

3.2 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 2

"ඩිජිටල් රාජ්‍ය පාලනයේදී සක්‍රීය පුරවැසි සහභාගීත්වය මගින් ලබාදෙන විසඳුම් සැමදෙනාම අන්තර්ගත වන පරිදි සකසා ගැනීමට උපකාරී වේ. එමගින් පුරවැසියන්ගේ තොරතුරු සහ සේවා අවශ්‍යතා වලට ගරු කරමින් ඔවුන්ගේ අපේක්ෂාවන් උපරිම ලෙස ඉටුකරනු ලබයි."

මෙම අන්තර්ගත කිරීම් මූල්‍යමය හෝ සාමාජීය විය හැකිය. මූල්‍යමය අන්තර්ගත කිරීම යනු පුද්ගලයන්ට සහ ව්‍යාපාර වලට ඔවුන්ගේ අවශ්‍යතා (ගණුදෙනු, ගෙවීම්, ඉතිරි කිරීම්, ණය සහ රක්ෂණය) වගකීමෙන් යුතුව සහ තිරසාර ලෙස[9] සපයමින් ප්‍රයෝජනවත් සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රවේශය ලැබිය හැකි පරිසරයක් නිර්මාණය කිරීමයි. අනෙක් කරුණ වන, සාමාජීය අන්තර්ගත කිරීම යනු පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට සාමාජීය සහභාගීත්වය සඳහා ඇති ඉඩකඩ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියයි. විශේෂයෙන්ම අනන්‍යතාවය මත පදනම්ව වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා හැකියාව, අවස්ථාව සහ ගරුත්වය මත සමාජය සමඟ බද්ධ වීමට හැකිවීමයි[10]. වඩා හොඳ ඩිජිටල් රාජ්‍යයක් මෙම අවශ්‍යතා දෙකම එකවර සපුරාලයි.

ඊට අමතරව, ගතික සහ අඛණ්ඩ පුරවැසි සහභාගීත්වය ඇතිව යහපාලන ප්‍රමිතීන් සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය වන විනිවිදභාවය ඩිජිටල් රාජ්‍ය විසින් ලඟාකර දෙයි.

මෙම අරමුණු අත්පත්කර ගැනීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග වන්නේ ;

1. ව්‍යවස්ථා, රාජ්‍ය ප්‍රතිපත්ති සහ පාලනයේ වෙනත් අංග සම්පාදනයේදී අවශ්‍ය යැයි සැලකෙන පරිදි මහජන අදහස් ලබා ගැනීම.

    a. සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම ඕනෑම සේවාවක් ආරම්භ කිරීමට පෙර පුරවැසියන්ගේ දුක්ගැනවිලි, පැමිණිලි, අදහස් සහ නිරීක්ෂණ ලබාගැනීමෙන් ක්‍රියාකාරී පුරවැසි සහභාගීත්වය/දායකත්වය සහතික කිරීම.

---

9 https://www.worldbank.org/en/topic/financialinclusion/overview
10 https://www.worldbank.org/en/topic/social-inclusion

b. ජාතික ව්‍යවස්ථා, ප්‍රතිපත්ති, රෙගුලාසි, සැලසුම් සහ අයවැය යනාදිය සැකසීමේදී අවශ්‍ය පරිදි පුළුල් මහජන සහභාගීත්වයක් ලබා ගැනීම සඳහා අන්තර්ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික වේදිකා, ජංගම දුරකථන, වෙබ් අඩවි, විද්‍යුත් තැපැල, බ්ලොග්, මාර්ගගත සාකච්ඡා සංසද සහ සමාජ මාධ්‍ය වැනි බහුවිධ මාධ්‍යයන් හරහා පුරවැසි අන්තර් ක්‍රියා සඳහා පහසුකම් සැපයීම.

2. සෑම විටම විද්‍යුත් මාධ්‍ය හරහා පුරවැසියන්ට දැකගතහැකි නිවැරදි කිරීම්/පසු විපරම් ක්‍රියා සිදු කිරීම සහ එයට අවසර දීම.

   a. පුරවැසියන්ගෙන් ලබාගත් දුක්ගැනවිලි, පැමිණිලි, අදහස්, නිරීක්ෂණ යනාදිය සම්බන්ධයෙන් සමාලෝචනය කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වගකිවයුතු පුද්ගලයෙකු හෝ ඒකකයක් පිහිටවිය යුතු වේ.

   b. පුරවැසියන් සම්බන්ධ කරගැනීම සඳහා එක යාන්ත්‍රණයක් භාවිතා කරමින්, ඔවුන්ගේ ගැටළු පිළියම් ප්‍රතිඵල දැනුවත් කිරීම.

3. දත්ත ආරක්ෂණ නීති විධිවිධානවලට අනුකූලව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු ලබාගැනීමේ හැකියාව සහතික කිරීම.

   a. පුරවැසියන්ට වැදගත් වන තොරතුරු වෙත ප්‍රවේශ වීමට හැකි පරිසරයක් ස්ථාපිත කිරීම.

   b. අරමුණ සඳහා ගැලපෙන පරිදි විවිධ වේදිකාවන් නිර්මාණය කිරීම.

   c. මහජනතාවට තොරතුරු නිකුත් කිරීම සඳහා වගකිව යුතු ආයතන ප්‍රධානීන්, තොරතුරු නිලධාරීන් පත් කිරීම සහ බලගැන්වීම.

   d. සෑම විටම කඩිනමින් තොරතුරු ලබාදී විශ්වාසය දිනාගනිමින් ලැබෙන විමසුම් සංඛ්‍යාව ඵලදායී ලෙස අඩු කිරීම.

   e. එම ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා හැකි වෙනස් ඵලදායී පහසු ඩිජිටල් මාධ්‍යයන් හඳුන්වාදීම.

3.3 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 3

ශක්තිමත් නීතිමය රාමුවක් තුළින් ඩිජිටල් රාජ්‍ය පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම UN-OHCHR පවසන පරිදි, රාජ්‍ය සේවාවන් මහජනතාවට ලබා දීමේ පොදු අයිතිය පිළිබඳ වගකීම වඩා හොඳින් ක්‍රියාත්මකවීමේ වර්ධනය මගින් ප්‍රකාශිත වන්නේ මානව හිමිකම් ගණනාවක් ආරක්ෂා වන බවයි . ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ආහාර සඳහා ඇති අයිතිය, ප්‍රතිසංස්කරණ මුලපිරීම්වලට වගවීමේ සහ විනිවිදභාවයේ යාන්ත්‍රණයන්, සේවාවන් සැමට ප්‍රවේශ විය හැකි සහ පිළිගත හැකි බව සහතික කිරීම, සංස්කෘතික වශයෙන් සංවේදී ප්‍රතිපත්ති මෙවලම් සහ තීරණ ගැනීමේදී මහජන සහභාගීත්වය[11] සඳහා මාර්ග ඇතුළත් විය හැකි බව එමගින් එහි වැඩිදුරටත් තහවුරුවේ.

මේවා සාක්ෂාත් කර ගැනීම සඳහා වන අවශ්‍යතා ;

1. සෑම රාජ්‍ය ආයතනයක්ම, සතුව තමා හසුරුවන්නේ කුමන දත්තද මගින්ද, ඒ දත්ත වලින් අදහස් කරන්නේ කුමක්ද, ඒවා භාවිතා කළ හැක්කේ කුමක් සඳහාද, ඔවුන් කුමන ක්‍රියාවලීන්හි කොටස්කරුවන්ද, සහ ඒවා භාවිතා කළ හැක්කේ කාටද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක් තිබීම.

2. සෑම ක්‍රියාකාරී සංවිධානය විසින්ම, ආයතනික තොරතුරු ආරක්ෂණ ක්‍රියා පටිපාටි[12] සකස් කිරීම සහ සම්මත කිරීම.

    a. පුද්ගලික දත්ත සහ තොරතුරු ආරක්ෂිතව තබා ගැනීම; එම දත්ත සහ තොරතුරු හෙළිදරව් කළ හැක්කේ, එවැනි නිකුත් කිරීම් පාලනය කරන නීති රීති අනුව පමණි.

[11] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය, යහපාලනය සහ මානව හිමිකම් https://www.ohchr.org/EN/Issues/Development/GoodGovernance/Pages/GoodGovernanceIndex.aspx

[12] මෙය ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ උපාය මාර්ගය සමඟ සමපාත විය යුතුය. https://www.cert.gov.lk/Downloads/NCSStrategy.pdf

එවැනි දත්ත සහ තොරතුරු[13] පාලනය කරන නීති, රෙගුලාසි සහ රීති අවශ්‍ය වන තාක් කල් සුදුසු යාන්ත්‍රණයක් භාවිතා කිරීම.

b. රහස්‍යභාවය සහතික කිරීම සහ අනවසරයෙන් ප්‍රවේශ වීම, වෙනස් කිරීම, විකුර්ති කිරීම, සම්ප්‍රේෂණය කිරීම හෝ මකා දැමීම/ඉවත් කිරීම වැළැක්වීම[14] සඳහා ඩිජිටල් වාර්තා පවත්වාගෙන යාම.

c. තොරතුරු පද්ධති හා සම්බන්ධිත තොරතුරු සහ වත්කම් භාවිතයට පිළිගතහැකි ක්‍රමවේදයක් සැකසීම සහ ලේඛනගත කිරීම[15].

d. ආයතනික තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියේ පිළිගත් තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුව දත්ත ගබඩා කිරීමේ උපාංග බැහැර කිරීම/අලුත්වැඩියා කිරීම සිදු කිරීම.

e. පෙර පැවති තත්වය යල් පැනගිය හෝ අභාවයට පත්කෙරෙන[16] නව තාක්ෂණික සංවර්ධනයන්ට සාපේක්ෂව, සංරක්ෂණය කළ හැකි කාලසීමාව සැලකිල්ලට ගනිමින් දත්ත ගබඩා කළ හැකි නිවැරදි ක්‍රම තෝරා ගැනීම.

f. නිතිපතා උපස්ථ (Back-ups) ගැනීම සඳහා භාවිතා කරන මාධ්‍යයන් තාක්ෂණික සංවර්ධනයන් සමඟම යල්පැන ඇති තත්වයට පත්ව ඇත්දැයි වරින්වර පරීක්ෂා කිරීම. එසේ යල්පැන ඇති අවස්ථාවන්හිදී පැරණි උපස්ථ කට්ටල සම්පූර්ණයෙන්ම නව මාධ්‍යයකට මාරු කළ යුතුය[17].

[13] 2022 අංක 19 දරණ දත්ත ආරක්ෂණ පනත

[14] දැනට කෙටුම්පත් අදියරේ පසුවන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයේ ඩිජිටල් ලේඛන කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තියෙහි අන්තර්ගත විධිවිධානයන්, එම ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, ප්‍රධාන මාර්ගෝපදේශය ලෙස සැලකිය යුතුය.

[15] මෙය ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් හඳුන්වා දී ඇති තොරතුරු සහ සයිබර් ආරක්ෂණය පිළිබඳ උපායමාර්ග සහ ප්‍රතිපත්ති සමඟ සමපාත විය යුතුය.

[16] ජාතික තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හඳුන්වාදී ඇති 'මේඝය පළමුව' ප්‍රවේශය යනාදිය පිළිපැදීම අනිවාර්ය වේ.

[17] උපස්ථ සහතික කිරීම සඳහා මේඝ සේවා භාවිතය

3. පුද්ගලික දත්ත රහස්‍යතාව සහතික කරන අතරම, ඩිජිටල් රාජ්‍ය විසඳුම් සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

    a. ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියලුම දත්ත රැස් කිරීම.

    b. රාජ්‍ය ආයතනයන්හි ඩිජිටල් සංවර්තනයේ පරිණතභාවය විශ්ලේෂණය කිරීම[18].

    c. පුරවැසි කේන්ද්‍රීය ව්‍යාපාර මුල්කරගත් සංස්කෘතියක්/සමාජයක් නිර්මාණය කිරීම සඳහා සමස්ත ඩිජිටල් ආර්ථිකය වැඩිදියුණු කිරීම.

4. පවතින විසඳුම්වලට අමතරව, සැලසුම්වල ආරක්ෂාව දත්ත මත තහවුරු කිරීම, දත්ත ආරක්ෂාව සතිකකිරිම, සඳහා සයිබර් ආරක්‍ෂාව මෙන්ම පරිගණක අපරාධ පිළිබඳ නීති මගින් සම්පාදනය කර ඇති නෛතික මූලධර්මවලට අනුකූලව, කාලෝචිත සහ ගුණාත්මක සේවාවන් සැපයීම.

    a. ජාතික දත්ත හුවමාරුව (National Data Exchange) හරහා පුරවැසියන්ට ඒකාබද්ධ සේවාවක් ලබා දීමට රාජ්‍ය ආයතන සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

[18] මේ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින්, අනෙකුත් පාර්ශවයන්ගේ සහයෝගය ද ඇතිව, හඳුන්වාදී ඇති 'ශ්‍රී ලංකා රජයේ ඩිජිටල් පරිණතභාවය පිළිබඳ ආකෘතිය' භාවිතා කළ හැකිය.

3.4 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 4

"ඩිජිටල් රාජ්‍ය පාලනයේ අරමුණ වන්නේ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ ඒ සඳහා ඒ ඒ තත්ත්වයන්ට අවශ්‍ය ක්‍රියාදාමයක් සක්‍රීයව ප්‍රතිනිර්මාණය කිරීම මගින්, මුදල් කාලය ධනය ඉතිරි කරගනිමින් සමාජයට අර්ථවත් ප්‍රතිඵල

ඉ-රාජ්‍ය සේවා හඳුන්වා දීමට සිදුකෙරෙන තාක්ෂණික ප්‍රතිසංස්කරණ සඳහා විශාල ධනයක් වැයවනු ඇති බවට ඇතැම් අය දරණ මතය සැබෑවක් නොවන බව ඒ පිළිබඳ කරන ලද බොහෝ අධ්‍යයනයන් ගෙන් තහවුරුවී ඇත.

ආර්ථිකය යනු එක් අංශයක් පමණි. ඩිජිටල් රාජ්‍ය මගින් කාලය සහ පරිසරය අනුව රජයේ වැය අවම කරයි. එම අඩු පිරිවැයකින් ඉතිරි වන කාලය වඩාත් ඵලදායී ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට ඉඩ සලසයි.

මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වන්නේ;

1. අවශ්‍ය සෑම තැනකදීම ඩිජිටල් රාජ්‍ය විසඳුම් සැපයීම සඳහා තාක්ෂණික මූලධර්ම භාවිතා කරමින් සහ පුරවැසි කේන්ද්‍රීය විසඳුම් ක්‍රියාත්මක කරමින් සියලුම වෘත්තීය සංවිධාන ඔවුන්ගේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම.

   a. ඔවුන්ගේ සේවා සැපයීමේ ප්‍රමිතීන් ඇගයීම ලක්කරමින් ගැටළුවට හේතුවන අභියෝගාත්මක ක්ෂේත්‍ර සහ ක්‍රියාවලීන් හඳුනා ගැනීම.

   b. සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා පවතින ක්‍රියාවලි නැවත නැවත සකස් කිරීම

   c. නව තාක්ෂණික ක්‍රියාවලීන්හි වෙනස්කම්/වැඩිදියුණු කිරීම් ඇතුළත් කිරීම සඳහා ආයතනවල පරිශීලක අත්පොත් අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම.

2. සියලු ඩිජිටල් රාජ්‍ය සේවාවන් සඳහා එක් ප්‍රවේශයකින් (Single-Sign-On) පිවිසීමට හැකිවන පරිදි නව විසඳුම් සැලසුම් කිරීමට හැකිතාක් උත්සාහ කිරීම.

3. සෑම පද්ධතියකින්ම ප්‍රවේශයක් ඉල්ලාසිටීමට අවශ්‍ය නොවන පරිදි රාජ්‍ය අංශයේ සියලුම සංවිධානවලට, සියලුම පද්ධතිවලට බාධාවකින් තොරව භාවිතා කළ හැකි ශ්‍රී ලංකා අද්විතීය ඩිජිටල් අනන්‍යතාවය (Sri Lanka Unique Digital Identification) සම්බන්ධ ප්‍රමිතීන් මත පදනම් වූ තනි ඩිජිටල් අනන්‍යතාවයක්[19] හඳුන්වා දිය හැකිය. එමගින් රාජ්‍ය අංශයේ විවිධ අංශ සමග කාර්ය සබඳතා ගොඩනැගීම මගින් එකිනෙකට වෙනස් සහ ස්වාධීන ඩිජිටල් රාජ්‍ය සේවාවන් ස්වාධීනව නව්‍යකරණය කිරීමට ඉඩ සැලසේ. අන්තර් ක්‍රියාකාරී දත්ත ආකෘතියක් ස්ථාපිත කිරීම සඳහාත් සහයෝගී සහ හවුල් ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහාත් අන්තර් ක්‍රියාකාරීව කටයුතු කිරීමටත් මෙමගින් හැකිවේ.

4. රාජ්‍ය ආයතන විසින් තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම කඩිනම් ව්‍යාපෘති කළමනාකරණ කටයුත්තක් සේ සලකමින් ක්‍රමානුකූලව සහ සුචල්‍ය (Agile) ආකාරයෙන් සිදුකිරීම.

a. පිළිගත හැකි යුක්තිසහගත හේතුවක් නොමැතිනම් මෙය මාස හයක් තුළ වර්ධක ක්‍රියාපිළිවෙතක් මගින් සම්පූර්ණකල යුතුය.

b. අදියර-1 අත්‍යාවශ්‍ය විශේෂාංග සහිත 'අවම හැකියා ඇති නිෂ්පාදනයක්' (Minimum Viable Product) විය යුතු අතර, පසුකාලීනව අනෙකුත් අවශ්‍ය විශේෂාංග ඇතුළත් කළ හැකිය.

c. ව්‍යාපෘතිය තුළ සැලකිය යුතු අවදානම් සහගත තත්ත්වයන් තිබේ නම්, 'අවම හැකියා ඇති නිෂ්පාදනයට' (Minimum Viable Product) පෙර 'සංකල්පයේ සාධනය' (Proof of Concept) අදියරක් සේ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

---

[19] ඩිජිටල් අනන්‍යතාවය යනු පරිශීලකයාගේ නම, විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය යනාදියෙන් සමන්විත හඳුනාගැනීමේ කට්ටලයක් නැත්නම් යම් දෙයක් හෝ එය අනෙකුත් දේ සමඟ තිබෙන සම්බන්ධය හෝ විස්තර කෙරෙන ජෛවමිතිකයක් වේ. ඩිජිටල් අනන්‍යතාවයේ අයිතිය පෙන්වීමට නම් එහි හිමිකරු අදාළ සහතික කිරීමේ සාක්ෂි තමා සතුවන බව සනාථ කළ යුතුය. ඩිජිටල් කඩාකප්පල් කිරීම් සම්බන්ධව දිනෙන් දින වැඩිවන තර්ජනයන් හමුවේ, අයිතිය තහවුරු කරගැනීම සාක්ෂි කිහිපයක් යටතේ සිදු කෙරෙයි.

d. වර්ධනය කරන ලද සෑම අදියරක්ම සජීවී භාවිතය සඳහා යොමු කළයුතු අතර , එක් එක් අදියරවල අත්දැකීම් පසුකාලීන අවධීන්/නිකුතුවල සංවර්ධනයට උපයෝගිකරගත යුතුය.

5. නව විසඳුම් හැකිතාක් නැවත භාවිතා කළ හැකි ක්‍රමවේදයන්ගෙන් සමන්විත බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට පෙර සියලුම රාජ්‍ය ආයතන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් උපදෙස් ලබා ගත යුතුය.

   a. රාජ්‍ය ආයතන මෙම නව යෙදවුම් ක්‍රියාත්මක කිරීමට පෙර ඔවුන්ගේ තාක්ෂණික තීරණ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් පරීක්ෂා කර ගත යුතුය.

   b. සියලුම නව විසඳුම් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ලේඛනගත කර ඇති ඩිජිටල් සංවර්තන මාර්ග සිතියම් වලට අනුකූල බව සහතික කිරීම අනිවාර්ය වේ.

6. ජාතික දත්ත හුවමාරුව[20] (National Data Exchange) හරහා දත්ත පරිභෝජනය කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන අනෙකුත් තෙවන පාර්ශ්ව සංවිධාන සහ විශේෂිත අවස්ථාවන්හිදී පුද්ගලික ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම විසඳුම්, සේවා යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් (APIs) අනාවරණය කළ යුතු වේ.

7. තොරතුරු තාක්ෂණ සම්පත් එනම් තාක්ෂණික සම්පත් සහ මානව සම්පත්වල සම්පත් ප්‍රශස්තකරණය සහ ඵලදායිතාව සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් ගන්නා සියලුම ක්‍රියාමාර්ග සංකල්පීය මට්ටමෙන් එහාගිය උපරිම ප්‍රයෝජනය ලැබෙන ආකාරයට සකස් කලයුතුය.

[20] ක්‍රියාත්මක කිරීමට යෝජිත

8. නව විසඳුමක් ක්‍රියාත්මක කිරීමට පෙර, අනෙකුත් රාජ්‍ය ආයතන වල දැනටමත් පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම්වල ඇති හැකියාවන් පරීක්ෂා කිරීමෙන් ද්විගුණනය සිදු නොවීමට කටයුතු කිරීම[21].

   a. ශක්‍යතා තීරණයකට එළඹීමේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදේශනය අනිවාර්ය වේ

9. ශ්‍රී ලංකා රජය සපයන ලද බෙදා ගැණුනු පොකුරු යෙදුම් (Shared Cluster Applications) භාවිතා කිරීමේදී ද්විගුණනය වැළැක්වීම සහ වැඩි කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා වෙනත් පරස්පර විරෝධීතා ඇති නොවන ලෙසට කටයුතු කල බව පොකුරු සාමාජිකයින් විසින් සාධාරණීකරණය කිරීම අනිවාර්ය වේ.

   a. මහජන සේවා සැපයීමේදී ජාතික දත්ත හුවමාරුව (National Data Exchange), ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය (National Spatial Data Infrastructure), ලංකා රාජ්‍ය ජාලය (Lanka Government Network), මිඩ්ල්වෙයාර් යටිතල පහසුකම්, ලංකා රාජ්‍ය මේඝය (Lanka Government Cloud), ජංගම දුරකථන ද්වාරය, GovSMS, ලංකා රජයේ ගෙවීම් සේවාව (විද්‍යුත් ගෙවීම් සැකසීමට), රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය (Government Information Centre, මහජනතාවට සේවා සම්බන්ධ තොරතුරු සැපයීම සඳහා පුරවැසි සේවා සඳහා) ඇතුළුව, නමුත් එයට පමණක් සීමා නොවී, හැකිතාක් පොදු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් භාවිතා කිරීම.

10. ආයතනය තුළ හෝ විශේෂිත සේවා ඩොමේන් තුළ දැනටමත් එකතු කර ඇති තොරතුරු හැකිතාක් දුරට නැවත භාවිතා කිරීම.

   a. රාජ්‍ය ආයතන බෙදාගැනීම සඳහා සුදුසු වන ආකෘති වලින් ඔවුන්ගේ දත්ත කට්ටල නිර්මාණය කරගැනීම.

[21] රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ මුදල් අමාත්‍යාංශයෙගින් නිර්මාණය කරන ලද ඒකාබද්ධ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය, මූල්‍ය කළමනාකරණ පද්ධතිය හා බදු තොග/වත්කම් කළමනාකරණ පද්ධතිය යනාදී යෙදුම් දැනටමත් භාවිතය සඳහා ඇත. මෙහිදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට හෝ අදාළ අමාත්‍යාංශය යෙදුම් සංරචක හුවමාරු කරගැනීමේ ක්‍රමවේද සම්බන්ධීකරණය කළ හැක.

b. අන්තර් ආයතන උපදේශන සහ සම්මුතිය ඇතිව දත්ත හිමිකරුවන් තීරණය කිරීම.

c. එවැනි තොරතුරු ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානවල දත්ත හිමිකරුවන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

d. මධ්‍යස්ථාන වල එක් එක් දත්ත වාර්තාවේ සුවිශේෂත්වය සහතික වන ආකාරයට, ශ්‍රී ලංකා අද්විතීය ඩිජිටල් අනන්‍යතාවය (Sri Lanka Unique Digital Identification), සමාගම් ලියාපදිංචි අංකය, ඉඩම් හඳුනාගැනීමේ අංකය ආදී අනන්‍ය හැඳුනුම්පත් භාවිතා කිරීම. මධ්‍යස්ථාන වලින් දත්ත ලබාගැනීමට අදහස් කරන සංවිධාන, ඒ සඳහා දත්ත අන්තර් ක්‍රියාකාරීත්වය සඳහා ඔවුන්ගේ පද්ධතිවල ඇති එම අනන්‍යතා දත්ත ප්‍රමිතීන් භාවිතා කළ යුතුය.

e. සියලුම පද්ධති යහපත් ලෙස ක්‍රියාත්මක වී ඇති බව සහතික කිරීම සඳහා කලින් ප්‍රවේශ වූ දත්ත කිසියම් සංවර්තනයකට භාජනය වී ඇත්නම් දැනුම්දීම් සඳහා දායක වීමට ඕනෑම පරිශීලකයෙකුට ඉඩ ලබාදීම දීම.

f. අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රමිතීන්ට අනුකූල වන සහ ඒවා අනුගමනය කරන දත්ත භාරකරුවන් සමඟ සාකච්ඡා කර ලබා ගත හැකි සෑම දත්ත කොටසක් සඳහාම ක්‍රමලේඛය සංවර්ධනය කිරීම. එවිට දත්ත පරිභෝජනය කිරීමට කැමති අනෙක් අයට මෙම ප්‍රකාශිත දත්ත ඔවුන්ගේ අභ්‍යන්තර දත්ත පරිහරණ නිර්මාණ ශිල්පයට අනුවර්තනය කළ හැකිය.

11. රටේ පාරිසරික අවශ්‍යතා වලට සමගාමීව රාජ්‍ය ආයතන විසින් භාවිතා කරන ලද පරිගණක සහ අමතර උපකරණ සඳහා සවිස්තරාත්මක සහ ඵලදායී විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩසටහන් හඳුන්වාදීම[22].

[22] ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හෝ ඉ-අපද්‍රව්‍ය යනු පැරණි හෝ කැඩුණු විද්‍යුත් උපාංග වේ. අන්තරායකර අපද්‍රව්‍ය (උපලේඛනගත අපද්‍රව්‍ය) කළමනාකරණය පිළිබඳ රීතීන් ශ්‍රී ලංකාවට මුලින්ම හඳුන්වාදෙනු ලැබුවේ 2008 වසරේදී ජාතික පාරිසරික පනත මඟිනි. එම රෙගුලසීන්ට අනුව, ඉ-අපද්‍රව්‍ය සැලසුම්ගත අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කර ඇති අතර සෑම උත්පාදකයෙකුම, එක්රැස් කරන්නෙකුම, ප්‍රවාහනය කරන්නෙකුම, ප්‍රතිචක්‍රීකරණය කරන්නෙකුම සහ බැහැර කරන්නෙකුම ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතුය. ඊ- අපද්‍රව්‍ය එකතු කරන මධ්‍යස්ථාන දිවයින පුරා ස්ථාපිත කරමින් මධ්‍යම පරිසර අධිකාරිය අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගයද ඇතිව සියලු ඉලෙක්ට්‍රොනික උපාංග එකතු කිරීමටත් බැහැර කිරීමටත් වැඩසටහනක් ආරම්භ කර ඇත. ඊ-අපද්‍රව්‍ය ලබාදිය යුත්තේ බලයලත් එකතු කරන්නන්ට පමණක් වන ලෙසට මධ්‍යම පරිසර

12. රාජ්‍ය ආයතනවල භාවිතය සඳහා භාවිත කළ ඩිජිටල් උපකරණ/ යන්ත්‍රෝපකරණ නැවත හඳුන්වා දීමට ඉඩ නොදිය යුතුවේ.

අධිකාරියට බලය පවරා ඇත. යම් රාජ්‍ය ආයතනයක් ඉ-අපද්‍රව්‍ය බැහැර කරන අවස්ථාවකදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති නියාමන අවශ්‍යතා අනුගමනය කිරීමට හැකි සෑම පියවරක්ම ගත යුතුය.

3.5 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 5

"ඩිජිටල් රාජ්‍යයක් මගින් විවෘතභාවය සහ වගවීම මගින් අල්ලසෙන් හා දූෂණයෙන් තොර සමාජයක් සඳහා විනිවිදභාවයෙන් යුතු රාමුවක් නිර්මාණය කරයි."

පුරවැසියන් සහ රජය අතර තිබෙන විශ්වාසය පදනම් වන්නේ රාජ්‍ය වියදම් කළමනාකරණය යහපත් කරවමින් සංවර්ධන කටයුතු සඳහා වැඩි අරමුදල් ප්‍රමාණයක් ඉතිරිවන පරිදි විනිවිදභාවයෙන් යුතුව මහජන සම්පත් පරිහරණය කිරීම තුළිනි. එමගින් පුරවැසි අයිතීන් සුරැකීම සහ සේවා පිරිවැය අවම කිරීම මගින් ප්‍රතිලාභ ලබන පුරවැසියන් සිටින වඩා සංවිධානාත්මක සමාජයන් බිහි කරයි.

මේ සඳහා ගතයුතු ක්‍රියා මාර්ග වන්නේ;

1. ක්‍රියාකාරකම් වල විවෘතභාවය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් නව නීති රාමු, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි නිර්මාණය කිරීම සහ යාවත්කාලීන කිරීම.

   a. දත්ත සහ ඩිජිටල් තාක්ෂණයේ ඒකාබද්ධ භාවිතය තුළින් අභ්‍යන්තර ප්‍රොටෝකෝල සැලසුම් කිරීම.

   b. විවෘතභාවය සහ විනිවිදභාවය සහිත ඩිජිටල් රාජ්‍ය විසඳුම් නැංවීම සඳහා පවත්නා නීති සමාලෝචනය සහ සංශෝධනය කරමින් මහජනතාවට වඩා කාර්යක්ෂම සහ අර්ථවත් සේවාවන් ඵලදායී ආකාරයෙන් ලබාදීම සහ අවශ්‍ය පරිදි නව නීතිරීතීන් හඳුන්වා දීම.

   c. තොරතුරු සරලව සහ තේරුම් ගත හැකි ආකාරයෙන් මහජනතාවට ලබා ගත හැකි බව සහතික කිරීම.

d. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත මගින් අර්ථ දක්වා ඇති පරිදි රාජ්‍ය රහස් වැනි ව්‍යතිරේකවලට යටත්ව නිසිලෙස ඉල්ලීමක් කලවිට විවිධ පුද්ගලයන්ට අදාළ තොරතුරු නිකුත් කිරීම.

2. 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මඟින් රාජ්‍ය ආයතන විසින් ඉලෙක්ට්‍රොනික ලියවිලි, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයන් භාවිතා කළයුතු ආකාරය අර්ථ දක්වා ඇති පරිදි ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් (සැකසීම, ගබඩා කිරීම, රඳවා තබා ගැනීම, සංක්‍රමණය කිරීම සහ ලේඛනගත කිරීම) දත්ත පවත්වාගෙන යාම.

a. 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත සහ 2018 ජාතික විගණන පනතට අදාළව සිදුකල ඕනෑම සංශෝධනයකට යටත්ව සහ අභ්‍යන්තර හෝ රජයේ විගණන අවශ්‍යතා සඳහා වන ප්‍රමිතීන් අනුගමනය කරමින් නිල භාෂා ත්‍රිත්වයෙන් ඕනෑම එකකින්, එනම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි, දත්ත ග්‍රහණය කර ගැනීමට, ගබඩා කිරීමට, සැකසීමට සහ සම්ප්‍රේෂණය කිරීමට රජයේ තොරතුරු පද්ධති සක්‍රීය කිරීම.

b. දත්ත කට්ටලවල සම්පූර්ණ බව පවත්වා ගැනීම සඳහා සිංහල/දෙමළ භාෂාවෙන් ලබාගත් දත්ත ඉංග්‍රීසි බසට අක්ෂර-පරිවර්තනය/පරිවර්තනය කර ඉංග්‍රීසි බසින් ගබඩා කිරීම.

c. කඩදාසි මත පදනම් වූ සහ පැරණි දත්ත පද්ධති පිරිසිදු කර යාවත්කාලීන කිරීමෙන් පසු ඩිජිටල් මාධ්‍යයට පරිවර්තනය කිරීම.

d. පුරවැසි දත්ත එක්රැස් කිරීමේ නීත්‍යානුකූල අවශ්‍යතා ඇති රාජ්‍ය පද්ධති මගින් සෑම විටම පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සිදුකල යුතු වේ. ඒ සඳහා 2022 අංක 19 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ යෝජිත සයිබර් ආරක්ෂණ පනත මගින් නිර්වචනය කර ඇති දත්ත ආරක්ෂණ සහ සයිබර් ආරක්ෂණ නීති සහ රෙගුලාසි, ක්‍රියාත්මක කිරීම පිළිපැදිම සිදුකල යුතුවේ.

e. නීත්‍යානුකූල හේතුවක් නොමැතිව එවැනි එකතු කරන ලද දත්ත වෙත ප්‍රවේශ නොවීම සහ බෙදා නොගැනීම සිදුකල යුතු වේ. (දත්ත හිමිකරුවන්ගෙන් නිසි අනුමැතිය/දත්ත ආරක්ෂණය, සයිබර් ආරක්ෂාව, පරිගණක අපරාධ පිළිබඳ පාලන නීතිවලට අනුකූලව)

f. දත්ත අවභාවිතය වැළැක්වීම සඳහා සැලසුම් ක්‍රියාවලියේදීම අවශ්‍ය සියලු පූර්වාරක්ෂාවන් ගැනීම අවශ්‍ය වේ.

3. පුරවැසියන්ගේ සහ ව්‍යාපාරවල අවශ්‍යතා සපුරාලීම සඳහා බහු නාලිකා හරහා එවැනි දත්ත සහ තොරතුරු ලබා ගත හැකි ආකාරය .

   a. එවැනි සියලු තොරතුරු www.gov.lk කේන්ද්‍රීය වේදිකාවේ ප්‍රකාශයට පත් කිරීම

   b. රාජ්‍ය ආයතනික වෙබ් අඩවි වැනි මාධ්‍යයන් නිර්මාණය කිරීමේදී, ඕනෑම උපාංගයකට පිවිසිය හැකි ඩිජිටල් රාජ්‍ය සේවාවන් වෙත ළඟා වීමට වඩාත් ජනප්‍රියව භාවිත කරන ක්‍රමය බවට පත්ව ඇති ස්මාර්ට් උපාංග වැනි ඒවාට ප්‍රමුඛත්වය දීම.

   c. රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය - 1919 සේවාවන් ඇතුළුව අවශ්‍ය නාලිකා භාවිතා කරමින් හඬ පදනම් කරගත් සේවා සැපයීම, නිවිකරණය කිරීම් හෝ යාවත්කාලීන කිරීම් මගින් සන්නිවේදනය සඳහා පහසු කිරීම සහ සහාය ලබා දීම

   d. පුරවැසියන්ට මතක තබා ගැනීමට වඩාත් පහසු කිරීම සඳහා 1919, හැකිතාක් දුරට, සියලුම රාජ්‍ය ආයතන සඳහා මුලිකම හඬ සේවාව ලෙස භාවිතා කිරීම. කෙසේ වෙතත්, අවශ්‍ය නම් රජයේ ආයතනවලට තමන්ගේම සම්බන්ධතා මධ්‍යස්ථාන අංක තිබිය හැකිය.

   e. ආබාධ සහිත පුරවැසියන්ට සහාය වීම සඳහා GIC-1919 වෙත නව විශේෂාංග හඳුන්වා දීම[23].

   f. සමාජ ජාල, RSS සංසද වැනි වෙබ් අනුබද්ධ තාක්ෂණයන් සහ වෙනත් සුදුසු සමාජ මාධ්‍ය හරහා තොරතුරු සැපයීම.

[23] මෙය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් පාලනය කෙරේ

g. සමාජ අනුග්‍රාහක සම්බන්ධතා කළමනාකරණය (Social Customer Relationship Management) සේවා ඒකාබද්ධ කිරීම හරහා ඩිජිටල් රාජ්‍ය සේවා සැපයීමේ සඵලතාවය සෑම නාලිකාවක්ම ද්වි-වාර්ෂිකව ඇගයීම.

4. පුරවැසියන්ගේ නීති හා රේගුලාසිමය අවශ්‍යතාවන්ට උපරිම ආකාරයෙන් ප්‍රමුඛත්වය දී කටයුතුකිරීම සදහා පය 24x7 පදනමින් සිංහල දෙමල ඉංග්‍රීසි ඕනෑම භාෂාවකින් සේවා ලබාගැනීමට හැකිවන පරිදි පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් ඉලෙක්ට්‍රොනිකව බහු නාලිකා හරහා ලබාදීම සිදුකල යුතු වේ.

   a. එක් එක් රාජ්‍ය සේවා ආයතනවල ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සේවාවන් නිර්මාණය කිරීම.

   b. කාර්යාල ප්‍රවේශයෙහි ඒකාබද්ධ පිවිසුම් කාර්යාලය (Unified Front Office/One-Stop-Shop), බහුකාර්ය කියෝස්ක් දුරකථන සේවා, විද්‍යුත් තැපෑල, වෙබ්, හඬ, SMS, ජංගම දුරකථන සේවා වැනි බහු නාලිකා සඳහා විවිධ ප්‍රවේශයන් සැකසීම.

   c. සෑම විටම රාජ්‍ය සේවා සහ වෙබ් අඩවි වෙත පරිශීලකයින්ට ළඟා වීමට ප්‍රමාණවත් තරංග පරාසයක් ලබාදීම සඳහා විශ්වාසනීයත්වය, පරිමාණය සහ ලබාගත හැකි බව තහවුරු කරමින් යටිතල පහසුකම් සැලසුම් කිරීම[24].

   d. ගනුදෙනු වලට අදාළ සේවා සැපයීමේදී 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත (ගනුදෙනු සේවා සැපයීම සඳහා සංශෝධන සහිතව ඉදිරිපත් වූ) මගින් හඳුන්වාදී ඇති විධිවිධාන පිළිපැදීම (ඉලෙක්ට්‍රොනික ගෙවීම් රජයේ ආයතන විසින් පිරිනමනු ලබන සේවාවන් සඳහා පිළිගත හැක).

   e. සියලුම පාර්ශවකරුවන් සඳහා අවශ්‍ය පරිදි සියලුම ඩිජිටල් ලෙස සක්‍රිය කරනලද සේවාවන් සඳහා සම්මත ක්‍රියා පටිපාටි අත්පොත්/ක්‍රියාවලි අත්පොත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් සකස් කිරීම.

[24] 'මේඝය පළමුව' ප්‍රවේශයට සාර්ථක මට්ටමින් පරිවර්තනය වීමේ අදියරක ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සිටී

f. සපයනු ලබන සේවා වර්ගය, එවැනි සේවාවන් සඳහා වන පිරිවැය, බෙදා හැරීමේ කාලය යනාදිය පිළිබඳ තොරතුරු සැපයීම සෑම සේවා සපයන ආයතනයකම ප්‍රදර්ශනය කලයුතුවේ.

5. බාධාවකින් තොරව ඒකාබද්ධ සේවා සැපයීම සඳහා ('සම්බන්ධිත රාජ්‍ය සේවා') රාජ්‍ය හෝ රාජ්‍ය නොවන, දේශීය හෝ ජාත්‍යන්තර වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කලයුතු වේ.

   a. එකඟ වූ පාලන සහ දත්ත හුවමාරු ප්‍රතිපත්ති රාමු වලට අනුව රාජ්‍ය ආයතන දත්ත හුවමාරු කරගැනීම සහ සහයෝගිත්වයෙන් කටයුතු කිරීම[25].

   b. බාධාවකින් තොරව සේවාලාභී කේන්ද්‍රීය සේවා සැපයීම සඳහා අවශ්‍ය දත්ත සහ සේවා ලබා ගැනීම සහතික කිරීම සඳහා අවශ්‍ය පූර්ව සහ පසු අන්ත යෙදුම් (back-end and front-end) සංවර්ධනය කිරීම.

   c. විවෘත දත්ත ලෙස අන්‍යයන්ට සකස් නොකළ දත්ත සහ/හෝ දත්ත සේවා සැපයීම, නොවන ලෙස ‘metadata’ වැනි දත්ත ආකෘතියකට අනුකූලව ඉදිරිපත් කිරීම. එමගින් ජාතික ආරක්ෂාව සහ ආයතනික ප්‍රතිපත්ති කඩ කිරීම, පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම, හඳුනාගත හැකි (පුද්ගලයින්, නිශ්චිත ස්ථාන, ආදිය) සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ විවෘත දත්ත මූලධර්මවලට අනුකූලව ඕනෑම ව්‍යවස්ථාපිත හෝ නීතිමය අවශ්‍යතා කඩ කිරීම සිදු නොවිය යුතු.

6. ජාතික දත්ත හුවමාරුව (National Data Exchange) සහ ලංකා අන්තර් ක්‍රියාකාරීත්ව රාමුව (Lanka Interoperability Framework)[26] විසින් නිර්වචනය කර ඇති විවෘත සහ අන්තර් ක්‍රියාකාරීත්ව ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම මගින් සම්බන්ධිත සේවා බෙදා හැරීම (පුරවැසි-හිතකාමී සහ බාධාවකින් තොරව) ලබා දීම.

[25] මෙම අවශ්‍යතාව සපුරාලීමට දත්ත අයිතිකරුවන් විසින් මූලික දත්ත සහතික කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබාදිය යුතු අතර අන්‍යෝන්‍ය අවබෝධය මත සේවා සැපයිය යුතුය. දත්ත ලබන්නා විසින් ඒවායෙහි රහස්‍යභාවය මෙන්ම පෞද්ගලිකත්වය සුරක්ෂිත කළ යුතුය.

[26] ඇමුණුම 5 - ලංකා අන්තර් ක්‍රියාකාරීත්ව රාමුව (LIFe)

a. ඩිජිටල් රාජ්‍ය පද්ධති සංවර්ධනය, තොරතුරු තාක්ෂණ නිෂ්පාදන මිලදී ගැනීම සහ වාර්තා සංරක්ෂණය කිරීමේදී අන්තර් ක්‍රියාකාරීත්වය, විකුණුම්කරුවන්ගේ මධ්‍යස්ථභාවය සහ නම්‍යශීලී බව සහතික කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතන විවෘත ප්‍රමිතීන් (Open Standards) භාවිතා කිරීම[27].

7. සියලුම රාජ්‍ය ආයතන විවෘත දත්ත ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු අතර අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහ පෞද්ගලික අංශය සමඟ පවා කටයුතු කිරීමේදී සුදුසු පරිදි තත්කාලීනව පවතින නීතිරීති[28] අනුගමනය කළ යුතුය.

[27] සියලුම රාජ්‍ය ආයතන විසින් තොරතුරු පිළිබඳ තම ආයතනය අයත් විෂයපථය හඳුනාගැනීම සහ ඒ අනුව ජාතික දත්ත හුවමාරුව සහ ලංකා අන්තර්ක්‍රියාකාරී රාමුව මඟින් හඳුන්වාදී ඇති ප්‍රමිතීන්ට අනුකූලව අන්තර්ක්‍රියාකාරී ප්‍රමිතීන්ට අනුගතවීම සහ ක්‍රියාත්මක කිරීම

[28] විශේෂයෙන් 2022 අංක 19 දරණ දත්ත ආරක්ෂණ පනත

3.6 ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රකාශ සහ අරමුණු අංක 6

"ඩිජිටල් රාජ්‍ය පාලනය යනු වෙනසකට මාවතක් මිස අවසාන ඉලක්කයක් නොවේ. එය අඛණ්ඩ පර්යේෂණ මගින් දියුණු තාක්ෂණ විසඳුම් ලබාදෙමින් සමාජය වඩා ශිෂ්ට සම්පන්න, ප්‍රබුද්ධ, සංවේදී, නිරෝගී සහ තිරසාර ස්ථානයක් බවට පත්කරන අඛණ්ඩ නව්‍ය සංවර්තනයක් වේ".

ජනතාව සැමවිටම උසස් සේවාවන් අපේක්ෂා කිරීම හේතුවෙන් ඩිජිටල් රාජ්‍ය සංකල්පය අඛණ්ඩ වර්ධනයක් පෙන්වයි. මෙය නොයෙක් වර්ධනයන්, සමාලෝචනයන් සහ යාවත්කලීනවීම් වලට ලක්වෙමින් කලානුරූපී විසඳුම් සපයයි. නවෝත්පාදනයට අවශ්‍ය වන්නේ නව නිර්මාණ කිරීමයි. එනම් දැනට පවතින දේ වර්ධනයන්ට ලක්කරමින් නව නිපැයුම් බිහිකිරීමට ඉලක්ක කිරීමයි. මේ සඳහා රාජ්‍ය යාන්ත්‍රණය තුල දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් පිරිසක් සිටීමත් ඔවුන්ට නිසි පරිදි පුහුණුව ලබාදීමත් අත්‍යවශ්‍ය වේ. එමෙන්ම සියලු නව ක්‍රියාවලින් පර්යේෂණ සහ සංවර්ධනයන් මගින් ශක්තිමත් කිරීමද වැදගත් වේ.

මෙය සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය වන්නේ ;

1. සෑම රාජ්‍ය සංවිධානයකම ඩිජිටල් සංවර්තන මාර්ග සිතියම මගින් අර්ථ දක්වා ඇති පරිදි, ආයතන ප්‍රධානියා විසින්, එහි ඩිජිටල් රාජ්‍ය සංවර්තන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීමට ප්‍රධාන ඩිජිටල් තොරතුරු නිලධාරියෙකු (Chief Digital Information Officer) පත් කිරීම.

2. තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් උපායමාර්ගයේ සියලුම අංශ මෙහෙයවීමේ වගකීම දරන සහ රජයේ ඩිජිටල් නිපුණතා රාමුවට (Government Digital Competency Framework) සමගාමීව පහසුකම් සපයන දක්ෂ හා ධනාත්මක පුද්ගලයෙකුගේ ප්‍රායෝගික අත්දැකීම් සහිත ප්‍රධාන තොරතුරු නිලධාරියෙකුගේ සහ ප්‍රධාන ඩිජිටල් නිලධාරියෙකුගේ පළපුරුද්ද සහ කුසලතා සංකලනය වූ තනතුරක් ලෙස ප්‍රධාන ඩිජිටල් තොරතුරු නිලධාරි තනතුර හඳුනාගැනීම.

3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන් සහ ව්‍යාපෘති අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ කෙරෙන අතුරු මුහුණතක් ලෙස ප්‍රධාන ඩිජිටල් තොරතුරු නිලධාරියා විසින් තම සංවිධානය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම.

    a. තම ආයතනය තුල තිබෙන ඩිජිටල් රාජ්‍ය අවශ්‍යතා පිළිබඳ පර්යේෂණ කිරීම සහ තීරණය කිරීම.
    b. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය කිරිම පිළිබඳ තිබෙන අවශ්‍යතා ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කිරීම.
    c. අවම වශයෙන් සෑම මාස තුනකට වරක් හෝ සුදුසු පරිදි ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නම් කරන ලද නිලධාරියා සමඟ තම ආයතනය විසින් ඩිජිටල් රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව එක්ව කටයුතු කිරීම.
    d. තම ආයතනයේ ඩිජිටල් රාජ්‍ය පරිණතභාවයේ වර්තමාන මට්ටම හඳුනාගෙන එය වැඩිදියුණු කිරීමෙන් ආයතනයට අවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම ලබා දීම.
    e. තම ආයතනය බාහිරින් ලබාගන්නා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතින්හි තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණික මෙහෙයුම් සඳහා සමස්ත වගකීම දරමින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ චක්‍රය කළමනාකරණය කිරීමේ වගකීම දැරීම.

4. සියලුම ඩිජිටල් රාජ්‍ය විසඳුම් සඳහා නිසි තොරතුරු පද්ධති පාලන රාමුවක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

    a. එක් එක් ප්‍රධාන ඩිජිටල් තොරතුරු නිලධාරියාගේ නායකත්වය යටතේ, එවැනි යෙදුම්වල සංවර්ධන පිරිවැය සලකා බලමින් සංවිධානයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කළ යුතු ආකාරය විස්තර කරන වාර්ෂික සහ කෙටි කාලීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැලැස්මක් කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

b. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ එක්ව (ද්විගුණනය වැළැක්වීමට) ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන කටයුතු සඳහා මෙන්ම පවතින උපකරණ, පද්ධති සහ ජාල නඩත්තු කිරීම සඳහා ද ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම.

c. පාර්ශවකරුවන්ගේ කැපවීම, සහභාගීත්වය, සහාය සහ සහයෝගීතාවය සහතික කිරීම සඳහා එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන සෑම අවස්ථාවකම ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම.

d. ඩිජිටල් රාජ්‍ය විසඳුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා නිසි තොරතුරු පද්ධති පාලන රාමුවක් අනුගමනය කිරීම, ක්‍රියාත්ම කිරීම සහ පවත්වාගෙන යාම.

e. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිවලට සම්බන්ධ සේවකයින් ආයතන තුළ හෝ ආයතන අතර මාරුවීම් සිදුවන අවස්ථාවන් වලදී /විශ්‍රාම යන අවස්ථා වලදී ව්‍යාපෘති වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

f. 'ඡායා නිලධාරියෙකු' (Shadow Officer) පත් කිරීම - ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතීන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන කුසලතා ඇති එයට සම්බන්ධ එක් එක් නිලධාරියා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියේ සියලුම අංග පිළිබඳව දැනුවත් නිලධාරියෙකි. පෙර සඳහන් කරන ලද නිලධාරියෙකු සඳහා ස්ථාන මාරුවක්, රැකියාවෙන් ඉවත්වීමක් හෝ උසස් වීමක් සිදුවුවහොත්, ඔහු හෝ ඇය වෙනුවට එම ව්‍යාපෘති කටයුතු සොයාබැලීමට යොදාගත හැකිය.

g. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතියකට සම්බන්ධ නිලධාරියෙකු ස්ථානමාරුවක් ලදහොත් ඔහු හෝ ඇය මෙතෙක් සිදුකළ රාජකාරි කටයුතු භාරදීමේ කාලසීමාවක් පවතින බව සහතික කිරීම.

h. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිවල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීමටත් අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වේලාවට තොරතුරු ලබා ගැනීම සහතික කිරීමටත් සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

5. මහා භාණ්ඩාගාරය විසින් නියම කර ඇති පරිදි නිවැරදි ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ භාවිතයන් පිළිපැදීම සහ තවදුරටත්;

a. කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළැඹීමෙන් පසුව පමණක් බාහිර පාර්ශවයන් විසින් රජය සඳහා මෘදුකාංග සහ දෘඩාංග සංවර්ධනය ක්‍රියාත්මක කිරීම.

b. ඕනෑම ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතියක් (මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 10 කට වැඩි) ආරම්භ කිරීමට පෙර, පහත සඳහන් කරුණු තහවුරු කරගැනීම සඳහා, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදේශනය වෙත යොමුවීම.

   i. අන්තර් ක්‍රියාකාරීත්වය සහ දේශීයකරණ අවශ්‍යතා සම්බන්ධයෙන් සියලුම රාජ්‍ය ආයතනවලට අදාළ වන ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම.
   ii. එවැනි ව්‍යාපෘති රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතියට ඒකාබද්ධ කළ හැකි බවට සහතික වීම

යම් රාජ්‍ය ආයතනයකට මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 10 කට අඩු ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදේශනය අවශ්‍ය බව හැඟෙයි නම්, එය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත යොමුකළ හැක.

c. ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර යනාදී දෘඩාංග භාණ්ඩ මිලදී ගැනීමේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් එහි වෙබ් අඩවිය වන www.icta.lk හි ඉදිරිපත් කර ඇති සම්මත තාක්ෂණික පිරිවිතරයන් වෙත යොමුවීම.

d. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ, මුදල් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ අදාළ 'ප්‍රසම්පාදන අත්පොත සහ මාර්ගෝපදේශ' අනුව සහ වෙනත් අදාළ රෙගුලාසි වලට අනුකූලව තොරතුරු පද්ධති, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ, මෘදුකාංග, මෘදුකාංග සංවර්ධන සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය කිරීම[29].

e. විවෘත ප්‍රභව මෘදුකාංග (Open-source Software) රජයට වඩාත් ලාභදායී මෘදුකාංග යෙදුම් හඳුන්වාදෙන බැවින් ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති සඳහා, සුදුසු පරිදි, විවෘත ප්‍රභව (Open-source) පදනම් කරගත් යෝජනා ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම. එවැනි පහසුකම් පහත සඳහන් නිර්ණායක සපුරාලිය යුතුය. ඒවා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සපුරාලිය නොහැකිවිට, සම්පූර්ණ පිරිවැය ඵලදායීතාවය සහ තිරසාර බව සහතික කිරීම සඳහා මූල්‍යමය වශයෙන් තරඟකාරී වෙළඳපල විසඳුම් වෙත සැමවිටම යොමුවිය යුතුය.

   i. ආයෝජන මත ප්‍රතිලාභ සහ හිමිකාරිත්වයේ සම්පූර්ණ පිරිවැය රජයට හිතකර වීම.
   ii. අනෙකුත් විසඳුම් සමඟ සැසඳීමේදී ක්‍රියාත්මක කිරීමට පහසුවීම.
   iii. ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රමිතීන් සපුරාලීම.

කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ අංගයන් සැලකිල්ලට ගනිමින් වඩාත් සුදුසු යාන්ත්‍රණය, එනම් විවෘත ප්‍රභව (Open-source) හෝ වෙළඳපල විසඳුම්, තීරණය කිරීම අදාළ රාජ්‍ය ආයතනය සතුය.

f. යෝජනාවල පිරිවැය ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රමාණය සහ ස්වභාවය අනුව වසර 3-7 ක් සඳහා ආයෝජන මත ප්‍රතිලාභ ඇගයීම.

[29] ප්‍රතිසම්පාදනය හා සම්බන්ධ මෙහෙයුම් කටයුතු වලදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මගපෙන්වීම ලබාගැනීම. මහා පරිමාණයේ (ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 10 ඉක්මවන ව්‍යවසාය මට්ටමේ විසඳුම්) තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සඳහා ප්‍රතිසම්පදන කමිටුවට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් නම් කරන ලද එක් නිලධාරියෙකු ඇතුළත් කරගැනීම.

g. බලපත්‍ර සහිත මෘදුකාංග, හිමිකාර (Proprietary) හෝ විවෘත ප්‍රභව (Open-source), පමණක් යෝජනා කරන ව්‍යාපෘති සැලකිල්ලට ගැනීම[30].

h. රජය සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීමේදී, හැකි සෑමවිටම, බුද්ධිමය දේපළ අයිතිය රජයට පැවරීම සහතික කිරීම.

i. ඩෙස්ක්ටොප් මත මෘදුකාංග ස්ථාපනය කිරීමේදී, බුද්ධිමය දේපල අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි, පද්ධති පරිපාලකයෙකු හෝ බලයලත් පුද්ගලයින් විසින් පමණක් ස්ථාපනය කිරීම.

j. මුදල් අමාත්‍යාංශය ඇතුළු අදාළ අමාත්‍යාංශ විසින් නිකුත් කරනු ලබන කාලාවර්තක රෙගුලාසි අනුගමනය කිරීම.

6. ප්‍රමාණවත් කළමනාකරණ සහ ආරක්ෂක ප්‍රතිපත්ති අනුගමනය කරමින් ඉන්ටර්නෙට් (Internet) සහ ඉන්ට්‍රානෙට් (Intranet) භාවිතය සහ එහි ආරක්ෂාව සහතික කිරීම.

a. ආයතනයේ ප්‍රතිපත්ති සහ චර්යාධර්ම සංග්‍රහවලට අනුකූලව ඉන්ටර්නෙට් (Internet)/ඉන්ට්‍රානෙට් (Intranet) භාවිතය පිළිබඳ පරිශීලකයන්ට මගපෙන්වීම සඳහා ඉන්ටර්නෙට් (Internet)/ඉන්ට්‍රානෙට් (Intranet) භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

b. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව ආයතනික තොරතුරු ආරක්ෂාව පවත්වාගෙන යාම.

c. ආයතනයේ කළමනාකාරිත්වය විසින් අනුමැතිය ලබාදීමෙන් පසුව පමණක් ස්ථානීය ජාල (LAN) සහ විද්‍යුත් තැපැල් ගිණුම් නිර්මාණය කිරීම සහ සේවකයෙකු ආයතනයෙන් ඉවත් වූ දිනයේම ඒවා අක්‍රීය කිරීම.

[30] වලංගු *බලපත්‍රයක්* නොමැති මෘදුකාංග භාවිතය හෝ *බලපත්‍ර* නියමයන් අනුගමනය නොකර *බලපත්‍ර* සහිත මෘදුකාංග වෙනස් කිරීම සහ අභිරුචිකරණය 2003 බුද්ධිමය දේපල පනතට පටහැනි වන අතර එහි ප්‍රතිඵලය නෛතික දණ්ඩනයන් (අපරාධ සහ සිවිල් වගකීම) විය හැක.

d. ස්ථානීය ජාල (LAN) ගිණුම් පවත්වා ගැනීමට, ජාලය තුල ඇති පරිගණක සඳහා නම් යෙදීමට සම්මත ආකෘතින් හඳුන්වාදීම.

e. ආපදාවකින් හෝ මාධ්‍ය බිඳවැටීමකින් පසු අත්‍යවශ්‍ය සියලු තොරතුරු සහ මෘදුකාංග නැවත ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් උපස්ථ පහසුකම් සැපයීම.

f. ලංකා රාජ්‍ය ජාලය (Lanka Government Network) මගින් සලසන පහසුකම් (සියලුම රාජ්‍ය ආයතන කාර්ය මණ්ඩල සඳහා අන්තර්ජාල පහසුකම සැපයීම සඳහා වන අනිවාර්ය ක්‍රමය) නිසි ලෙස භාවිතා කිරීම.

g. ඉන්ටර්නෙට් (Internet) සහ ඉන්ට්‍රානෙට් (Intranet) භාවිතය පිළිබඳ ලංකා රාජ්‍ය ජාලයට (Lanka Government Network) අදාළ ප්‍රතිපත්තිවලට අනුකූල වීම; විශේෂයෙන්ම ඉන්ටර්නෙට් (Internet) ප්‍රවේශය පැවරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම යනාදී කරුණු සම්බන්ධව.

7. ඩිජිටල් රාජ්‍ය සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

a. ඩිජිටල් සංවර්තනය සඳහා ආයතනික අවශ්‍යතා සපුරාලීමට ‘ඩිජිටල් ධාරිතා රාමුව’ (Digital Competency Framework) ඵලදායී ලෙස යෙදවීම මගින්, සියලුම තරාතිරම්වල කාර්ය මණ්ඩලය සඳහා වන මානව සම්පත් ධාරිතා සංවර්ධන අවශ්‍යතාවයන් වාර්ෂිකව තක්සේරු කිරීම.

b. ආයතනික මානව සම්පත් සැලැස්මෙහි සැලකිය යුතු අංගයක් ලෙස 'ඩිජිටල් සංවර්තනයට අදාළ මානව සම්පත් ධාරිතා වර්ධනය' ඇතුළත් කිරීම.

c. රාජ්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ මධ්‍යම කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම නිලධාරීන්ට තම දෛනික කටයුතුවලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය පිළිබඳ නිපුණතාවක් තිබීම සහ එම නිපුණතාවය අත්කර ගැනීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සහ පුහුණුව ලබා දීම.

d. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රවීණ සහ/හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාළව සුදුසුකම් ලබා ඇති කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා සුදුසු දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

e. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මගින් රජය විසින් අනුමත පරිගණක සුදුසුකම් ලබා ගැනීමට රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල සාමාජිකයින් දිරිමත් කිරීම.

f. ප්‍රධාන ඩිජිටල් තොරතුරු නිලධාරීන් විසින් ඩිජිටල් රාජ්‍ය සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ, විශේෂයෙන් නැගී එන තාක්ෂණයන්ට අදාළව, ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීම සහතික කිරීම.

g. සියලුම නැගී එන තාක්ෂණයන් සහ ප්‍රවණතා පිළිබඳ රජයේ කාර්යමණ්ඩල වල අඛණ්ඩ ප්‍රගතිය සහතික කිරීම.

8. සෑම ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතියක් සඳහාම රජයේ ආයතන විසින් අවදානම් තක්සේරුවක් සිදු කිරීම.

9. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ සාකච්ඡා කර එකඟ වූ පරිදි, යෝග්‍ය අධීක්ෂණ සහ ඇගයීම් රාමු සහ දර්ශක වලට අනුව තම ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘතිවල නිමැවුම් සහ ප්‍රතිඵල ඇගයීම සඳහා සියලුම රාජ්‍ය ආයතන විසින් ඵලදායී අධීක්‍ෂණය සහ ඇගයීම් සිදු කිරීම.

10. ඩිජිටල් රාජ්‍ය සේවා භාවිතා කරන්නන්ට සහය වෙමින්, ඔවුන්ගේ විශ්වාසය ගොඩනගා ගනිමින් සහ ඔවුන්ගේ තෘප්තිමත් බව තක්සේරු කරමින් සියලු පාර්ශවකරුවන් වෙත ඩිජිටල් රාජ්‍ය තොරතුරු බෙදාහැරීම සඳහා සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සන්නිවේදන සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.

11. ජාතික ඩිජිටල් සංවර්තන ක්‍රියාවලියට සහයවීම සහ එය ප්‍රවර්ධනය සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සහ රාජ්‍ය නිලධාරියෙක් විසින්ම දිරිමත් කිරීමින්, හිතකර සහ

සංවර්ධිත පරිසරයක් අත්පත් කරගැනීම සඳහා එය ධනාත්මකව වැළඳ ගැනීමට දායක වීම.

1 වන ඇමුණුම - ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/GPA/Circular/01/2020

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

My No: PS/GPA/Circular/01/2020
January 13, 2020

To: **All Secretaries of Ministries**
All Secretaries of State Ministries
All Chief Secretaries
All Secretaries to Governors
All Heads of Departments
All Heads of Statutory Organizations

Positioning the Information and Communication Technology Agency (ICTA) of Sri Lanka to drive National Digital Initiatives of the Government

It has been observed that many government agencies are implementing information technology based solutions in isolation and in a compartmentalized culture of service delivery. This, in addition, has resulted in a lack of a cohesive, coordinated approach to build a whole-of-government framework where data should be shared across systems for providing citizen-centric services effectively and efficiently.

Furthermore, despite such initiatives outcomes have not been efficient, cost effective and public centric. Instead, due to the demand for extra employees, buildings and logistic facilities, service delivery cost has risen. It has also led to wasteful public expenditure programmes in the national budget. This compartmentalized strategy has also tapped foreign funding from different sources, engaged consultants and project management teams, and created wasteful expenditure on non-compatible systems and equipment.

In this background, His Excellency the President has directed that all ICT/digital solutions having an impact on citizen service delivery should be implemented under the overall management and supervision of the Information and Communication Technology Agency (ICTA) of Sri Lanka to ensure the following:

a. Provide public service delivery to the people in a cost-effective and people-friendly manner.
b. Ensure full compliance with the National Digital Policy and strategies of the government adopted by the Cabinet of Ministers from time to time.
c. Ensure optimal use of national-level ICT infrastructure (Lanka Government Cloud, Lanka Government Network, Payment Gateway, SMS gateway etc) as defined by the ICTA from time to time.
d. Ensure compliance with the technical and data architecture and standards formulated by the ICTA and approved by the Cabinet of Ministers from time to time.
e. Ensure compliance with digital law requirements such as the Electronic Transactions Act and data protection legislation.
f. Eliminate duplication of IT related work by several agencies and minimize the cost of repeated data collection and data entry efforts.
g. Enforce digital identity sharing to avoid inconvenience to citizens who transact online.

1/2

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන தொலைபேசி Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් தொலைநகல் Fax ++ 94 11 2446657
ඉ-තැපැල මின்-அஞ்சல் prsec@presidentsoffice.lk

Please convey the above instructions to all organizations and Project Directors under your purview and instruct to transfer such projects and programmes, including financial provision to the ICTA in a suitable manner in consultation with the Treasury regarding transfer of funding procedure. Any queries in the above regard may be directed to Chief Executive Officer of ICTA (email: ceo@icta.lk) with copy to Chairman, ICTA (email: chairman@icta.lk).

P B Jayasundera
Secretary to the President

CC: Secretary to the Prime Minister
Secretary to the Cabinet of Ministers
Secretary to the Treasury
Auditor General
Chairman, Information and Communication Technology Agency (ICTA) of Sri Lanka

2 වන ඇමුණුම

ඩිජිටල් රාජ්‍ය අභිලාෂයන් යුරෝපා කවුන්සිලයේ යහපාලන අරමුණු හා බැඳුනු ‘පාලනයේ විශිෂ්ටත්වය පිළිබඳ යුරෝපීය ලේබලයට’ අදාළ ආකෘතිය සමඟ ගැලපීම

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
1	පුරවැසියන්ගේ පහසුව	ඩිජිටල් රාජ්‍යයක **ප්‍රමුඛතාව** මෙන්ම **කේන්ද්‍රීය** සාධකය පුරවැසියා වේ. සියලු ඩිජිටල් **රාජ්‍ය** සේවාවන් (තොරතුරුමය හෝ ගනුදෙනුමය), පුරවැසියන්ගේ (පුද්ගලයින් හෝ **ව්‍යාපාර)** පහසුව වෙනුවෙන් සකස් කෙරේ	දෙවන ප්‍රතිපත්තිය: ප්‍රතිචාර දැක්වීම පුරවැසියන්ගේ නීත්‍යානුකූල බලාපොරොත්තු සහ අවශ්‍යතා වෙනුවෙන් අරමුණු, නීති, ආකෘතීන් සහ ක්‍රියා පටිපාටීන් යොදා ගැනීම. සාධාරණ කාලසීමාවක් තුලදී පොදු සේවාවන් සැපයීම, ඉල්ලීම් සහ පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම.
			තුන්වන ප්‍රතිපත්තිය: කාර්යක්ෂමතාව සහ ඵලදායීබව ප්‍රතිඵල මඟින් එකඟ වූ අරමුණු සාක්ෂාත් කරගැනීම. පවතින සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීම. කාර්ය සාධන කළමනාකරණ පද්ධති මඟින් සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීබව ඇගයීම සහ වැඩිදියුණු කිරීම. කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට සහ තක්සේරු කිරීමට නිශ්චිත කාල පරාසයන් තුල විගණනයන් සිදු කිරීම

[31] https://www.coe.int/en/web/good-governance/12-principles-and-eloge

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
2	වියදම අවම කරගැනීම	ඩිජිටල් පාලනයේ අරමුණ වන්නේ සැලකිය යුතු අන්දමින් වියදම අවම කරගැනීම සඳහා මූල්‍ය, කාලය සහ පාරිසරික යන අංශයන් තුල තිබෙන ක්‍රියා පටිපාටීන් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වෙනුවෙන් ප්‍රතිනිර්මාණය කර සමාජයට අර්ථවත් ප්‍රතිඵල ලඟාකර දීමයි.	හත්වන ප්‍රතිපත්තිය: නිපුණත්වය සහ ධාරිතාව පාලනයෙහි නිරත වන්නන්ගේ ඵලදායීතාව සහ බලපෑම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ වෘත්තීය කුසලතාවය අඛණ්ඩව ශක්තිමත්ව පවත්වා ගැනීම. රාජ්‍ය සේවකයන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් අඛණ්ඩව දිරිමත් කිරීම නිපුනතාවය ධාරිතාවය බවට පරිවර්තනය කිරීමටත් වඩා හොඳ ප්‍රතිඵල අත්පත් කරගැනීමටත් ප්‍රායෝගික ක්‍රමවේද සහ ක්‍රියා පටිපාටීන් හඳුන්වාදීම සහ භාවිතය.
			දහවන ප්‍රතිපත්තිය: යහපත් මූල්‍ය කළමනාකරණය වෙනස්වීම්, විශේෂයෙන් වැදගත් රාජ්‍ය සේවාවන්හි, සේවා පිරිවැය ඉක්මවා නොයන අතර ඉල්ලුම අධික ලෙස පහත නොදමයි. ගිවිසුම් සහ ණය, සම්පත්/ආදායම සහ තැන්පතු ඇස්තමේන්තු කිරීම, සුවිශේෂී ආදායම් භාවිතය ඇතුළු මූල්‍ය කළමනාකරණය තුල විචක්ෂණශීලී බව නිරීක්ෂණය කල හැකිය.

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			බහු වාර්ෂික අයවැය සැලසුම් සැකසීමේදී මහජන අදහස් ලබා ගැනීම ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනය ඇතුළුව අවදානම් තත්වයන් නිසි පරිදි ඇස්තමේන්තු කර කළමනාකරණය කිරීම. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයක් ඇති අවස්ථා වලදී අවදානම යථාර්ථවාදී ලෙස බෙදාගැනීම. අන්තර් නාගරික සහයෝගීතාව, සාධාරණ පරිදි ප්‍රතිලාභ සහ ගැටළු බෙදාගැනීම සහ අවධානම අවම කිරීම (පද්ධති, අන්තර් නාගරික සහයෝගීතාව, අවදානම් අන්‍යෝන්‍යකරණය) යනාදිය සැලසීම සඳහා පළාත් පාලන ආයතන හවුල් වීම.
3	පුරවැසි සහභාගීත්වය	ඩිජිටල් පාලනයේදී සක්‍රීය පුරවැසි සහභාගීත්වය මඟින් ලබාදෙන විසඳුම් සැමදෙනාම අන්තර්ගත වන පරිදි සකසා ගැනීමට උපකාරී වේ. එමගින් පුරවැසියන්ගේ තොරතුරු සහ සේවා අවශ්‍යතා වලට ගරු කරමින් ඔවුන්ගේ අපේක්ෂාවන් උපරිම ලෙස ඉටුකරනු ලබයි	පළමුවන ප්‍රතිපත්තිය: සාධාරණ මැතිවරණ, නියෝජනය සහ සහභාගීත්වය වංචා වලින් තොරව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ ජාතික ව්‍යවස්ථාවන්ට අනුව නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීම. රාජ්‍ය ක්‍රියාවන්හි කේන්ද්‍රය වන්නේ පුරවැසියන්ය. එබැවින් දේශීය මට්ටමෙන් මහජන කටයුතු සඳහා පැහැදිලි ක්‍රමවේදයන් මඟින් ඔවුන්ගේ සහභාගීත්වය තහවුරු කිරීම

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට සෘජුව හෝ ඔවුන්ගේ අවශ්‍යතා නියෝජනය කරන නීත්‍යානුකූල අතරමැදි ආයතන හරහා තීරණ ගැනීමේදී හඬක් නැගිය හැක. එවැනි පුළුල් සහභාගීත්වයක් ගොඩනැගෙන්නේ ප්‍රකාශනයේ, රැස්වීමේ සහ ආශ්‍රය කිරීමේ නිදහස මතය. අඩු වරප්‍රසාද ලත් සහ වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ද ඇතුළුව සියලුදෙනාගේම හඬ සම්පත් වෙන් කිරීම ඇතුළුව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සැලකිල්ලට ගැනීම. විවිධ නීත්‍යානුකූල අවශ්‍යතා සමථකරණයට සහ සමස්ත ප්‍රජාවගේ යහපතට අවශ්‍යම කුමක්ද සහ එය අත්කර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳ පුළුල් එකඟතාවයකට පැමිණීමට සෑමවිටම අවංක උත්සාහයක් දැරීම. සුළුතරයගේ අයිතිවාසිකම් සහ නීත්‍යානුකූල අවශ්‍යතාවලට ගරු කරමින් බහුතරයගේ කැමැත්තට අනුව තීරණ ගැනීම.
			හතරවන ප්‍රතිපත්තිය: විවෘතභාවය සහ විනිවිදභාවය නීති සහ රෙගුලාසි වලට අනුව තීරණ ගැනීම සහ බලාත්මක කිරීම.

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			නීතිය මගින් සලසා ඇති පරිදි නිශ්චිත හේතූන් මත වර්ගීකරණය නොකළ (පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම හෝ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවල සාධාරණත්වය සහතික කිරීම වැනි) සියලුම තොරතුරු සඳහා මහජනතාවට ප්‍රවේශය ඇත. තීරණ, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල පිළිබඳ තොරතුරු, පළාත් පාලන ආයතනවල වැඩකටයුතු වලට ඵලදායී ලෙස දායක වීමට සහ අනුගමනය කිරීමට හැකි වන පරිදි, මහජනතාවට ලබා දීම.
4	විධිමත් සමාජයක්	ඩිජිටල් රාජ්‍යයක් මගින් විවෘතභාවය සහ වගවීම මගින් අල්ලසෙන් හා දූෂණයෙන් තොර විධිමත් සමාජයක් සඳහා මගපාදයි	පස්වන ප්‍රතිපත්තිය: නීතියේ ආධිපත්‍ය පළාත් පාලන ආයතන නීතියට සහ අධිකරණ තීන්දුවලට යටත් වේ. නීතියෙන් සපයා ඇති ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් නීති රීති සම්මත කර ගන්නා අතර ඒවා අපක්ෂපාතීව ක්‍රියාත්මක කෙරේ.
			එකොළොස්වන ප්‍රතිපත්තිය: මානව අයිතිවාසිකම්, සංස්කෘතික විවිධත්වය සහ සමාජ ඒකාබද්ධතාවය පළාත් පාලන ආයතනවල බලපෑම් ක්ෂේත්‍රය තුළ, මානව හිමිකම්වලට ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ ක්‍රියාත්මක

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			කිරීම සහ ඕනෑම පදනමක් මත වෙනස්කම් වලට ලක්කිරීමට එරෙහිව සටන් කරනු ලැබේ. සංස්කෘතික විවිධත්වය සම්පතක් ලෙස සලකනු ලබන අතර, දේශීය ප්‍රජාව තුළ සියල්ලන්ටම කොටස් ඇති බව සහතික කිරීමට, එය හඳුනා ගැනීමට සහ බැහැර කිරීමක් නොදැනෙන බව සහතික කිරීමට අඛණ්ඩ උත්සාහයන් ගැනීම. සමාජ ඒකාබද්ධතාවය සහ අවාසි සහගත කොටස් ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය සේවා සඳහා ප්‍රවේශය, විශේෂයෙන් වරප්‍රසාද නොලත් කොටස් සඳහා, තහවුරු කිරීම.
5	පුරවැසි අයිතීන් ආරක්ෂා කිරීම	ශක්තිමත් නීතිමය රාමුවක් තුළින් ඩිජිටල් රාජ්‍ය පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරයි.	හයවන ප්‍රතිපත්තිය: සදාචාරාත්මක හැසිරීම පෞද්ගලික අවශ්‍යතා වලට වඩා මහජන යහපතට ප්‍රමුඛස්ථානයක් දීම. සියලු ආකාරයේ දූෂණ වැළැක්වීමට සහ ඒ සඳහා සටන් කිරීමට ඵලදායී ක්‍රම සැලසීම. අවශ්‍යතා පිළිබඳ ගැටුම් නියමිත වේලාවට ප්‍රකාශ කිරීම සහ ඊට සම්බන්ධ පුද්ගලයින් අදාළ තීරණ ගැනීමට සහභාගී වීමෙන් වැළකී සිටීම.

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			දොළොස්වන ප්‍රතිපත්තිය: වගවීම සියලුම තීරණ ගන්නන්, සාමූහික සහ තනි පුද්ගල, තම තීරණ සඳහා වගකීම භාර ගනී. තීරණ පිළිබඳව වාර්තා කර, පැහැදිලි කර, අනුමත කරගත හැක. නොමනා පරිපාලනයට සහ සිවිල් අයිතිවාසිකම් කඩ කෙරෙන පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරකම් වලට එරෙහිව ඵලදායී පිළියම් ඇත.
6	නවෝත්පාදන සංවර්ධනය	ඩිජිටල් පාලනය යනු වෙනසකට මාධ්‍යයක් මිස අවසාන ඉලක්කයක් නොවේ. එය අඛණ්ඩ පර්යේෂණ මගින් දියුණු තාක්ෂණ විසඳුම් ලබාදෙමින් සමාජය වඩා සංස්කෘතික, ප්‍රබුද්ධ, අනුකම්පා සහගත, සෞඛ්‍යසම්පන්න සහ තිරසාර ස්ථානයක් බවට පත්කරන අඛණ්ඩ නව්‍ය සංවර්ධනයක් වේ	අටවන ප්‍රතිපත්තිය: නව්‍යකරණය සහ වෙනස් කිරීමට විවෘතබව ගැටළු සඳහා නව සහ කාර්යක්ෂම විසඳුම් සෙවීම සහ සේවා සැපයීමේ නවීන ක්‍රමවල වාසිය ලබා ගැනීම. නව වැඩසටහන් අත්හදා බැලීමට සහ අන් අයගේ අත්දැකීම් මගින් ඉගෙන ගැනීමට සූදානමක් තිබීම. වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වෙනසකට හිතැති වටපිටාවක් නිර්මාණය කිරීම
			නවවන ප්‍රතිපත්තිය: තිරසාරභාවය සහ දීර්ඝකාලීන පෙළගැස්ම

අංකය	මාතෘකාව	ඩිජිටල් රාජ්‍ය අභිලාශය	අදාළ වන යහපාලන ප්‍රතිපත්තිය (යුරෝපා කවුන්සිලයේ ප්‍රතිපත්තීන් 12ට අනුව[31])
			වර්තමාන ප්‍රතිපත්ති තුල අනාගත පරපුරෙහි අවශ්‍යතා සැලකිල්ලට ගැනීම. ප්‍රජාවෙහි තිරසාරත්වය නිතර සැලකිල්ලට ගැනීම. තීරණ ගත යුත්තේ සියලු වියදම් අභ්‍යන්තරීකරණය කිරීමට මිස පාරිසරික, ව්‍යුහාත්මක, මූල්‍ය, ආර්ථික හෝ සමාජීය විය හැකි ගැටළු සහ ආතතීන් අනාගත පරම්පරාවට පැවරීමට නොවේ. සංවර්ධනය සඳහා අවශ්‍ය දේ පිළිබඳ හැඟීමක් සමඟ දේශීය ප්‍රජාවගේ අනාගතය පිළිබඳ පුළුල් හා දිගුකාලීන ඉදිරි දර්ශනයක් තිබීම මෙම ඉදිරි දර්ශනය පදනම් වී ඇති ඓතිහාසික, සංස්කෘතික හා සමාජීය සංකීර්ණතා පිළිබඳ අවබෝධයක් තිබීම

3 වන ඇමුණුම

කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඩිජිටල් රාජ්‍ය සංවර්තන සැලැස්මට අනුව 'ඩිජිටල් රාජ්‍ය ' සංකල්පය වෙත රජයේ ප්‍රවේශය

රජයේ ප්‍රධාන මුලපිරීමක් වන 'ඩිජිටල් රාජ්‍ය ' සංකල්පයෙහි මූලිකම හරය වන්නේ රාජ්‍ය ආයතන වඩා කාර්යක්ෂම, ඵලදායී, ලාභදායී සහ තිරසාර ආයතන බවට සංවර්තනය කිරීමයි. ඩිජිටල් සංවර්තනය මඟින් සෙසු පද්ධතීන් සමඟ වඩා පහසුවෙන් ඒකාබද්ධව කටයුතු කිරීමට උපකාරී වන අතරම රාජ්‍ය ආයතන අතර සම්බන්ධය සහ තාක්ෂණයට අනුවර්තනයවීමේ හැකියාව වැඩිදියුණු කරයි. රජය තුළ මෙම ඩිජිටල් සංවර්තනය සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත පැවරී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ඩිජිටල් පාලනය පිළිබඳ ආකෘතිය අදියර කිහියක් (පදනම, හවුල් විසඳුම්, පොදු ප්‍රවේශය, ව්‍යාපාර විසඳුම්, පරිශීලකයන් ආදී වශයෙන්) යටතේ දැනටමත් සකසා ඇත. පදනම් අදියර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයේ ප්‍රධාන වගකීම වන අතර සෙසු අදියරයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් විසින් නොයෙකුත් පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කරයි. ලංකා රාජ්‍ය ජාලය සහ ලංකා රාජ්‍ය මේඝය ස්ථාපිත කරමින් පදනම් අදියර දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. පදනම් අදියර සම්පූර්ණ කිරීම සඳහා අනන්‍යතාව සහ අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ වේදිකාව සහ ජාතික අවකාශීය පද්ධතිය නිර්මාණය කිරීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් මේ වනවිට අරඹා ඇත.

එය නිම කිරීමෙන් පසුව රාජ්‍ය ආයතන වලට තම කටයුතු කරගෙන යාම සඳහා තොරතුරු හුවමාරු කරගැනීමටත් ආයතන අතර සහයෝගිතාව වැඩි කරගැනීමටත් හැකිවනු ඇත. උදාහරණයක් ලෙස දැනට පවතින තත්වය යටතේ ජාතික හැඳුනුම්පතක් හෝ ගුවන්ගමන් බලපත්‍රයක් සාදාගැනීමට අවශ්‍ය පුද්ගලයෙකුට රාජ්‍ය ආයතන ගණනාවක් වෙත යා යුතුය. එනම් අවශ්‍ය ලියවිලි සැකසා ගැනීම සඳහා ග්‍රාමසේවා නිලධරී, ආගමන හා විගමන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදී විවිධ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන්ගේ සේවය ලබාගත යුතුය. නමුත් ජාතික දත්ත හුවමාරුව මඟින් අදාළ සේවාවන්

ලබාදෙන ආයතනයට අවශ්‍ය සියලු තොරතුරු (සෙසු රාජ්‍ය දෙපාර්තමේන්තු වලට අදාළ තොරතුරු ද ඇතුළුව) එකම ස්ථානයකින් ලබාගත හැකි වේ.



ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම (National Spatial Data Infrastructure/NSDI) යනු රජය තුල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාව වැඩිදියුණු කරගැනීම සඳහා රාජ්‍ය ආයතන අතර අන්තර් ක්‍රියාකාරීත්වය, අනුකූලතාවය සහ සහයෝගිතාවය ඇතිකරවන ප්‍රධාන මාධ්‍යයකි. එමගින් දත්ත ද්විකරණය වළක්වමින්, රාජ්‍ය ආයතන අතර දත්ත හුවමාරුවේදී ගුණාත්මකබව සහ විනිවිදභාවය දියුණු කරමින් සහ අවකාශීය දත්ත මත පදනම් වූ තීරණ

සඳහා සහාය මෙවලම් සැකසීමට තාක්ෂණික මාධ්‍යයක් ලබාදෙමින් අවකාශීය දත්ත ප්‍රමිතිකරණයට ලක් කරයි. ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම රාජ්‍ය ආයතන ඵලදායී ලෙස භාවිතා කිරීමෙන් රජය තුල ඩිජිටල් සංවර්තන ක්‍රියාවලිය දිරිගැන්වෙන අතරම ප්‍රචලිත කරවයි.

සියලුම ඩිජිටල් විසඳුම් වල පදනම වන අනන්‍යතා අන්තර් ක්‍රියාකාරී වේදිකාව, පුද්ගලයින්ගේ අනන්‍යතාව ඩිජිටල් මාධ්‍යයෙන් තහවුරු කරගැනීමටත් වලංගු කරගැනීමටත් උපකාරී වෙයි. උදාහරණයක් ලෙස පුරවැසියෙකුට රියදුරු බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වුවහොත් අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කල පසු අදාළ රාජ්‍ය ආයතනය විසින් අයදුම්පත්‍රය සඳහා ක්‍රියාත්මක වීමට අවශ්‍ය දත්ත වලට ප්‍රවේශ වී අයදුම්කරුගේ අනන්‍යතාව සහ සුදුසුකම තහවුරු කරගනියි.

ඩිජිටල් සංවර්තන උපයමාර්ගයෙහි අනෙක් අදියර වන හවුල් විසඳුම් මඟින් බහුතරයක් රාජ්‍ය ආයතන මඟින් තම දෛනික කටයුතු සිදුකර ගැනීමට භාවිතා කරන මානව සම්පත් කළමනාකරණය, ගෙවීම්, වැටුප් ලේඛනය, ඊ-මේල් වැනි විසඳුම් ආවරණය කරයි. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය විසින් මේවයින් යම් ප්‍රමාණයක් නිර්මාණය කෙරෙන අතර මේ සඳහා ඔවුන් වෙනත් සේවාදායකයන්ගේ සහය ද ලබාගනී. ව්‍යාපාර විසඳුම් අදියර රාජ්‍ය ක්‍රියාවලින් සමඟ කටයුතු කරන ඩිජිටල් රාජ්‍ය පිළිබඳ සංකල්පයෙහි තවත් වැදගත් අංශයක් වේ. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් වැඩි බලපෑමක් ඇති ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා මෙම විසඳුම් වලින් 10-12 අතර ප්‍රමාණයක් තෝරාගෙන ක්‍රියාත්මක කරනු ඇත. මෙම ව්‍යාපෘති වල ආකෘතිය සහ නිර්මාණය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සතු වගකීමක් වන අතර ඒවායේ ක්‍රියාත්මක කිරීම, නඩත්තුව සහ සංවර්ධනය යන අංශයන් බාහිර පාර්ශවයන් හරහා ඉටු කරගනියි.

ව්‍යාපාර විසඳුම් නිර්මාණයට පාර්ශවකරුවන් සෙවීමේදී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විදෙශීය පාර්ශවකරුවන්ට වඩා දෙශීය සමාගම් සමඟ එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරයි. මෝටර් රථ තදබදය, අධ්‍යාපනය, ගමනාගමනය, සෞඛ්‍ය සේවය සහ අනෙකුත් අංශයන්ට අදාළව විසඳුම් නිර්මාණයට දේශීය සමාගම් දිරිගැන්වීමක් මේ මඟින් සිදුවෙයි. මේ සඳහා අවශ්‍ය වන විශේෂඥතාව සහ ධාරිතාව එක් ආයතනයක් සතුව නොමැති අවස්ථාවන්හිදී දේශීය ව්‍යවසායකයින් කිහිපයකට සාමූහිකව විසඳුම්

නිර්මාණයට යොමුවීමට ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ඉඩ සලසයි. මෙහිදී කලාපිය සහ නැඟී එන සමාගම් සමඟ කටයුතු කරන සමූහයන්ට ප්‍රමුඛතාව ලබාදෙන බව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය පවසයි.

	2020	2022	2024
යටිතල ව්‍යුහය	සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරී (50%ක භාවිතය)	25%කින් පුළුල් කර ඇත 100%ක භාවිතය	50%කින් පුළුල් කර ඇත 100%ක භාවිතය
අන්තර්ක්‍රියාකාරී රාමුව	නිර්මාණය කර සම්පූර්ණ කර ඇත	ප්‍රධාන ආයතන 50%ක් භාවිතයට ගෙන ඇත	ආයතන 100%ක් භාවිතයට ගෙන ඇත
හවුල් විසඳුම්	විසඳුම් 5ක් භාවිතයේ ඇත	විසඳුම් 20ක් භාවිතයේ ඇත	විසඳුම් 30කට වඩා භාවිතයේ ඇත
ව්‍යාපාර සේවා	ඩිජිටල් සේවා 5ක්	ඩිජිටල් සේවා 20ක්	ඩිජිටල් සේවා 50ක්

දේශීය සමාගම් විසින් මෙම විසඳුම් නිර්මාණයෙන් පසුව ඒවා විදේශයන්ට විකිණීමට ද හැකිවනු ඇත. උදාහරණයක් ලෙස මෙරට සමාගමක් විසින් කොළඹ කොටස් හුවමාරුව සඳහා නිර්මාණය කරන ලද විසඳුම තවත් ලොව පුරා ඇති කොටස් හුවමාරු කිහිපයකටම විකිණීම හැදින්විය හැක. මෙම ආකෘතිය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් දේශීය ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කල හැකි මෘදුකාංග සමාගම් සඳහා නව අවස්ථාවන් විවර කර දීමට උපයෝගී කරගනී.

රජයේ දැක්ම වන්නේ සෑම පුරවැසියෙකුටම ඩිජිටල් රාජ්‍ය සේවාවන් සපයාදීම වන අතර පොදු ප්‍රවේශය අදියර අවශ්‍ය වන්නේ මේ සඳහා ය. එය පරිශීලකයන් සහ විවිධ විසඳුම් මඟින් සපයා තිබෙන සේවාවන් අතර අන්තර් ක්‍රියා සිදුකිරීමට තිබෙන මාධ්‍යය ලෙස ක්‍රියා කරයි. මෙහිදී පරිගණකයක් හෝ තාක්ෂණ දැනුමක් නොමැති පුරවැසියන්ට සහයක් ලෙස ගම් මට්ටමින් සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීමට ද කටයුතු සම්පාදනය කෙරේ.

ඩිජිටල් රාජ්‍ය වැඩසටහනෙහි විවිධ සංරචකයන්ට අනුව අරමුණු කරගත් සහ බලාපොරොත්තු වන ප්‍රතිඵල අත්පත් කරගැනීමට නම් එම සෑම සංරචකයක් සඳහාම ප්‍රතිඵල කේන්ද්‍ර කරගත් අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වාදීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රමවේදයෙහි කොටසක් වන ඩිජිටල් රාජ්‍ය ව්‍යාපෘති හරහා විවිධ දත්ත එක්රැස් කරමින් මූලික පදනම ස්ථාපිත කරගැනීමෙන් පසු ප්‍රතිඵල සහ බලපෑම මැනගත හැකිය. මෙම ප්‍රයත්නයන්හි සමස්ථය හඳුනාගැනීම සඳහා එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් දත්ත අවශ්‍යතා, වගකීම්, ක්‍රමවේද සහ සංඛ්‍යාතය යනාදිය ගොඩනැඟිය යුතුය. තවද අයිතිය, නිසි වගකීම සහ වගවීම සම්බන්ධ කරුණු සහතික කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සහභාගිත්ව ක්‍රියාවලියක් ඇතිකරගත යුතුය.

4 වන ඇමුණුම - ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ගමන්මග

ශ්‍රී ලංකා රජය විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය නංවාලීමේ වැදගත්කම තහවුරු කරන ලද්දේ 1983 වසරේදී හඳුන්වාදෙන ලද ජාතික පරිගණක ප්‍රතිපත්තිය (National Computer Policy) මඟිනි. එවක ජනාධිපති උපදේශනයන් යටතේ මෙම ප්‍රථම වෑයම ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (Natural Resources, Energy and Science Authority of Sri Lanka) විසින් සිදුකරන ලදී. ඒ අනුව එම ආයතනය මඟින් පත්කරන ලද කමිටුවක් හරහා ජාතික පරිගණක ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත.

රජය විසින් ජාතික පරිගණක ප්‍රතිපත්තිය පිළිගනිම මඟින් ශ්‍රී ලංකා පරිගණක හා තොරතුරු තාක්ෂණ කවුන්සිලය (Computer and Information Technology Council of Sri Lanka) පිහිටුවීමට ඉඩකඩ වෙන්විය. පසුකාලීනව එය තොරතුරු තාක්ෂණය පිළිබඳ කවුන්සිලය ලෙස 1984 පාර්ලිමේන්තු පනත් අංක 10 මඟින් නම් කරන ලද අතර සෘජුවම එවක ජනාධිපතිවරයා යටතේ පවත්වාගෙන යාමට විධිවිධාන සලසන ලදී.

මෙරට ප්‍රථම 'විද්‍යුත් රජය' පිළිබඳ ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලය විසින් 2009 වසරේ දෙසැම්බර් මස සම්මත කරන ලද අතර 2010 සිට 2012 දක්වා සියලුම රාජ්‍ය ආයතන විසින් එය අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරන ලදී. එකී ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත නිසි බලතල පවරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් මෙම ප්‍රතිපත්තියෙහි අන්තර්ගතය, ක්‍රියාත්මක කිරීම සහ විමර්ශනය පිළිබඳ දැනුවත් කිරීමේ සමුළු සහ වැඩසටහන් මාලාවක් රාජ්‍ය කළමනාකාරවරුන්ගේ සහභාගිත්වයෙන් දිවයින පුරාම පවත්වන ලදී.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය විසින් 2010, 2011, 2012 සහ 2013 යන වසර වලදී 'විද්‍යුත් රජය' පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය සඳහා වාර්ෂිකව විමර්ශනයන් සිදු කරන ලදී. කණගාටුදායක ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයත් ඒ සඳහා සහභාගී වූ සෙසු රාජ්‍ය ආයතනත් කොපමණ පරිශ්‍රමයක් දැරුවද, මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාවට නැංවීමේ ප්‍රතිශතය ඉතාම පහල මට්ටමක විය.

මෙම තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනය විසින් අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ගේද දායකත්වයෙන් පහත සඳහන් තීරණයන්ට එළඹෙන ලදී.

- 'විද්‍යුත් රජය' පිළිබඳ ප්‍රතිපත්තිය තුල ඉතාම සංකීර්ණ වූ ප්‍රතිපත්තිමය අවශ්‍යතා තිබීම.

- ප්‍රතිපත්තිය ඉතා පුළුල් වීම. එහි ප්‍රතිපත්ති ප්‍රකාශ 29ක් සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ 177ක් වූ අතර විද්‍යුත් රජය සංකල්පය පිළිබඳ තම පරිණතභාවය කුමන මට්ටමක පැවතුනත් සියලුම රාජ්‍ය ආයතන විසින් එම ප්‍රකාශ සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කලයුතු විය.

- ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල වගකීම් නිසිලෙස හඳුනාගෙන නොතිබීම.

- ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ ඩිජිටල් තොරතුරු පිළිබඳ ප්‍රධාන නිලධාරීන්හට ඒ සම්බන්ධව පැහැදිලි අවබෝධයක් නොතිබීම. තවද, එම නිලධාරීන්ට ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලතල පැවරීමක් සිදුකර නොමැති වීම.

- රජයට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි අවශ්‍යතාව පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම (ප්‍රතිපත්ති අරමුණු පැහැදිලි නොවීම).

ඩිජිටල් රාජ්‍ය ප්‍රත්පත්ති සමාලෝචන කමිටුව

මෙම ප්‍රතිපත්තියෙහි සංශෝධිත පිටපත කෙටුම්පත් කිරීම සඳහා එවක ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපතිවරයා විසින් ප්‍රතිපත්ති සමාලෝචන කමිටුවක් පත්කරන ලදී.

එම කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය නිසි පරිදි සංශෝධනයන්ට ලක්කරමින් සහ යාවත්කාලීන කරමින් ඉහත සඳහන් ගැටළු පිළිබඳ සොයාබැලීම ආරම්භ කරන ලදී. තවද, ප්‍රතිපත්තිමය ප්‍රකාශන සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සඳහා මෙම කමිටුව විසින්

අනෙකුත් රටවල් මඟින් සම්පාදිත ලියවිලි අධ්‍යයනය කරන ලද අතර ඒවායින් උකහා ගත හැකි කරුණු ප්‍රතිපත්තියෙහි පළමු පිටපතට අන්තර්ගත කරන ලදී.

කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය සඳහා නව තේමාවකට එකඟ වූ අතර ප්‍රතිපත්ති ප්‍රකාශන 32ක් හඳුනාගනිමින් අරමුණු 10ක් කෙටුම්පත් කරන ලදී.

ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීම සඳහා කමිටුව විසින් කෘත්‍යාධිකාරී කමිටුවක් පත්කරන ලද අතර එම කෘත්‍යාධිකාරී කමිටුව විසින් වගකීම, වගවීම, උපදේශනය සහ දැනුවත්වීම යන සංකල්ප ඇතුලත් ව්‍යුහයක ආධාරයෙන් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම් හඳුනාගනිමින් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී.

රාජ්‍ය ආයතන වලට ඩිජිටල් රාජ්‍ය පරිණතභාවය පිළිබඳව තම මට්ටම හඳුනාගැනීමට සහ ප්‍රතිපත්තිමය අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමට වඩා පහසුදායක ක්‍රමවේදයක් කෘත්‍යාධිකාරී කමිටුව විසින් හඳුනාගන්නා ලදී.

<u>උපදේශක ක්‍රියාවලියෙන් ලද අදානය</u>

ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමෙන් පසුව වැඩි උපදේශනයක් ලබාගැනීම සඳහා රාජ්‍ය අංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරීන්ට සහ ඉහළ කළමනාකාරවරුන්ට, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ සහ නොවූ පෞද්ගලික අංශයේ කළමණාකාරවරුන්ට, ශාස්ත්‍රඥයින්ට සහ සිවිල් පුරවැසියන්ට ඉදිරිපත් කරන ලදී. එයට අමතරව මෙම ප්‍රතිපත්තිය තවදුරටත් වැඩි දියුණු කරගැනීමට පොදු මාධ්‍ය ඔස්සේ මහජන උපදේශනය වෙතද යොමුකරන ලදී.

උපදේශන ක්‍රියාවලියෙන් ලද ආදානය ලේඛන ද්විත්වයකට ඇතුලත් කර ගැණුනු අතර ඉන් එකක් වඩා සවිස්තරාත්මක වූ රාජ්‍ය අංශයේ මාර්ගෝපදේශයක් ලෙස භාවිත වන අභ්‍යන්තර ලියවිල්ලක් වේ. යම්තාක් දුරට කෙටි ලේඛනයක් වන දෙවැන්න, රාජ්‍ය අංශයටම පමණක් සීමා නොවී වැදගත් බාහිර පාර්ශව වලටද ඩිජිටල් රාජ්‍ය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි. එබැවින් මෙම ලියවිලි ද්විත්වයම ඉතාම වැදගත් වේ. තවද මෙම ලියවිල්ල නව්‍ය ආර්ථිකයක් සහ ඵලදායී රජයක් මගින් තිරසාර ඩිජිටල් ආර්ථික වර්ධනයක් උදාකරගැනීම සඳහා මූලධර්ම සහ සංකල්පීය ව්‍යුහයක් සපයමින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ඉදිරිපත් කර ඇති 2020-2024 දක්වා ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ඩිජිටල් සංවර්තන ප්‍රතිපත්තිය සමඟද ගැළපෙයි.

මෙම ප්‍රතිපත්තිය මෙරට නව ප්‍රතිපත්තිමය වටපිටාව සහ නව තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සමඟ කෙතරම් ගැලපෙනවාද යන්න සොයාබැලීම සඳහා දෙවන වරටත් පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් සමාලෝචනයකට ලක් කෙරුනි .

1. චන්දන රොද්‍රිගෝ මහතා - අතිරේක ලේකම්, තාක්ෂණ අමාත්‍යාංශය
2. ඒ. කේ. ආර්. අලවත්ත මහතා - අතිරේක ලේකම් (පරිපාලන), තාක්ෂණ අමාත්‍යාංශය
3. තුෂාර සුරවීර මහතා - අතිරේක ලේකම් (ප්‍රතිසංස්කරණ), අධිකරණ අමාත්‍යාංශය
4. ටී. ආර්. වරුණ ශ්‍රී ධනපාල මහතා - අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ), ස්වදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය
5. උදේශ් සෙනෙවිරත්න මහතා - ජ්‍යෂ්ඨ අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය
6. හිරන්යා සමරසේකර මහතා - ප්‍රධාන උපදේශක, තාක්ෂණ අමාත්‍යාංශය
7. බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා - කොමසාරිස් ජෙනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව
8. කාංචන තුඩුගල මහතා - ප්‍රධාන ඩිජිටල් රාජ්‍ය නිලධාරී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
9. සමීර ජයවර්ධන මහතා - සහකාර ප්‍රධාන ඩිජිටල් ආර්ථික නිලධාරී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
10. චානුක වත්තේගම මහතා - අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
11. සංජී බාලසූරිය මහතා - අධ්‍යක්ෂ (තොරතුරු ආරක්ෂණය), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
12. ගවෂ්කර් සුබ්‍රමානියම් මහතා - අධ්‍යක්ෂ (රාජ්‍ය මැදිහත්වීම්), ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
13. එම්. සී. එම්. ෆාරූක් මහතා - අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය), ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව
14. මාධවී එන්. ගුණවර්ධන මහත්මිය - අධ්‍යක්ෂ (පරිපාලන සහ ආයතනික කටයුතු), ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව
15. රන්ජන් මාරසිංහ මහතා - අධ්‍යක්ෂ (සැලසුම් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

16. ලලිත් වඩුගේ මහතා - අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන තාක්ෂණය), අධ්‍යාපන අමාත්‍යංශය (උසස් අධ්‍යාපන අංශය)
17. ආලෝක බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (රාජ්‍ය පරිපාලනය)
18. සමන්ති සේනානායක මහත්මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)
19. ශිරන්ති රත්නායක මහත්මිය - අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් (ජාතික ප්‍රතිපත්ති සැලසුම්)

5 වන ඇමුණුම - ශ්‍රී ලංකා අන්තර් ක්‍රියාකාරිත්ව රාමුව

ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ප්‍රකාශ කර ඇති පරිදි තාක්ෂණය මත පදනම් වූ සමාජයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා රජය කැප වී සිටියි. එය සාර්ථක කරගැනීමට නම් එකිනෙකට සම්බන්ධිත රාජ්‍ය සේවා, රාජ්‍ය ආයතන, පුරවැසියන් සහ ව්‍යාපාර වලින් සමන්විත ජාලයක් ගොඩනැඟීම ඉතාම වැදගත් වේ. එම සම්බන්ධය ලඟා කරගත හැකි වන්නේ විවිධ රාජ්‍ය ආයතනයන්හි තිබෙන තොරතුරු පද්ධතීන් නොකඩවා ක්‍රියාකාරීව පැවතීම තහවුරු කෙරෙන අන්තර් ක්‍රියාකාරී රාමුවක් ස්ථාපිත කිරීමෙනි. විවිධ රාජ්‍ය ආයතන සහ පද්ධතීන් යා කෙරෙන ශ්‍රී ලංකා අන්තර් ක්‍රියාකාරිත්ව රාමුව වැදගත් වන්නේ මෙම අරමුණ සඳහා වේ. ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ශ්‍රී ලංකා අන්තර් ක්‍රියාකාරිත්ව රාමුව ක්‍රියාවට නැංවීමේ වගකීමෙන් බැඳී සිටියි.

සියලුම රාජ්‍ය සේවාවන් එකම ස්ථානයකින් සැපයීමත් උපරිම මෙහෙයුම් හැකියාවක් අත්පත් කරගැනීමත් තනවුරු කෙරෙන විවෘත ප්‍රමිතීන් සමූහයක් ලෙස එය හැඳින්විය හැක. දැනට ශ්‍රී ලංකා අන්තර් ක්‍රියාකාරිත්ව රාමුව පහත සඳහන් විෂයපථයන්ගෙන් සමන්විත වේ.

- පෞද්ගලික තොරතුරු
- ඉඩම් තොරතුරු
- වාහන තොරතුරු
- ව්‍යාපෘති සම්බන්ධිකරණ තොරතුරු

අදාළ විෂයභාර අමාත්‍යංශයසමඟ සම්බන්ධ වෙමින් සෞඛ්‍ය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර සඳහා වන සැලසුම් මේ වනවිටත් ක්‍රියාත්මන වෙමින් පවතී. පහත සඳහන් අනෙකුත් ක්ෂේත්‍රයන්ට අදාළ සැලසුම් ඉදිරියෙදී ක්‍රියාත්මක වීමට නියමිතය.

- කෘෂිකර්මය
- ගමනාගමනය
- අධිකරණ සේවා
- වෙළඳ කටයුතු